# කොරියන් භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

**(2021 වසරේ සිට ක්‍රියාත්මක වේ.)**

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා  අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකා

*වෙබ් අඩවිය www.nie.lk*

*විද්‍යුත් තැපෑල  :info@nie.lk*

කොරියන් භාෂාව

ගුරු මාර්ගෝපදේශය

12 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2021

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*වෙබ් අඩවිය www.nie.lk*

*විද්‍යුත් තැපැල :info@nie.lk*

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

21 වන සියවසේ තෙවන දශකයට පා තබා ඇති මේ අවස්ථාවේ ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වී ඇතැයි සැලකේ. එහි වෙසෙන විවිධ ජාතීන් එකිනෙකා වෙත සමීප කරවීම සඳහා තාක්ෂණය සහ භාෂාව උපකාරී වේ. තාක්ෂණය මගින් භූගෝලීය දේශ සීමා මායිම් නොතකා හරිමින් ජාතීන් අතර සමීපතාව ගොඩනගා ඇත. එහෙත් ජාතීන්, අතර සංස්කෘතිමය වශයෙන් අන්‍යෝන්‍ය සහජීවනය සහ සහයෝගය ගොඩනැගීම සඳහා භාෂාව අත්‍යවශ්‍ය වේ.

ලෝකයේ බොහෝ රටවල් විදේශ භාෂා අධ්‍යාපනයේ ප්‍රායෝගික වැදගත්කම හඳුනාගෙන තම විෂයමාලාව තුලට විදේශ භාෂාවන් ඇතුලත් කර ඇත. එපමණකින් නොනැවතී ඒ සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කර ඒ සඳහා අවශ්‍ය මානව සහ භෞතික සම්පත් ලබා දී විදේශ භාෂා අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය සිසුන්ට ලබා දී ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාව තුළ විදේශ භාෂාවක් ඉගෙනීමේ අවස්ථාව සෑම පාසල් සිසුවකුටම ලබා දීමට මෙතෙක් අපොහොසත් වී ඇත. කෙසේ වෙතත් මේ වන විට ශ්‍රී ලංකාවේ විදේශ භාෂා අධ්‍යාපනය සඳහා අවස්ථා පුළුල් වෙමින් පවතින අතර ඒ සඳහා අවශ්‍ය මානව සහ භෞතික සම්පත් සංවර්ධනය කිරීමටද පියවර ගෙන ඇත.

විදේශ භාෂා අතරින් කොරියන් භාෂාව ශ්‍රී ලාංකිකයන් අතර අතිශයින් ජනප්‍රියය. විශේෂයෙන්ම කොරියානු රැකියා අවස්ථා ඉලක්ක කරමින් කොරියන් භාෂාව පාසල් අධ්‍යාපනයෙන් පසු ඉගෙන ගනු ලබන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වෙමින් පවති. කොරියන් භාෂාව ඉගෙනීමට ඇති අධික ඉල්ලුම සලකා බලමින් 2015 වර්ෂයේදී කොරියන් භාෂාව පාසල් විෂයමාලාවට ඇතුළත් කරන ලද අතර 2021 වර්ෂයේදී අ.පො.ස උසස් පෙළ සඳහාද භාෂාව ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත.

ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනය කොරියන් භාෂා පිළිබඳ විද්වත් කණ්ඩායමක් සමග එක්වී කොරියන් භාෂා විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත. පාසල් සිසුන් සඳහා කොරියන් භාෂා නිර්දිෂ්ඨ ග්‍රන්ථ සකස් කිරීමේදී කොරියානු තානාපති කාර්යාලය ලබා දෙන නිරන්තර දායකත්වය අගය කරමි. එමෙන්ම සම්භාව්‍ය භාෂා සහ විදේශ භාෂා අංශයේ නිලධාරීන් සහ කොරියන් භාෂාව සම්බන්ධ විෂයය ප්‍රවීනයන් මෙම කාර්යයන් සඳහා ලබා දෙන ශාස්ත්‍රීය දායකත්වයද ප්‍රශංසනීයව සිහිපත් කරමි.

ආචාර්ය දර්ශන සමරවීර

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

භාෂා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය :** ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය සම්බන්ධීකරණය සහ සංස්කරණය :** ආචාර්ය මධුභාෂිණී දෙල්දෙණිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සංස්කරණය :** එස්. සී. නිලානි
කථිකාචාර්ය
ශාස්ත්‍රවේදී (කැලණිය), ශාස්ත්‍රපති (කොරියාව)
නූතන භාෂා අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය :** **බාහිර**

ගයා ආරියවංශ
කථිකාචාර්ය (ආධුනික)
ශාස්ත්‍රවේදී (කැලණිය), ශාස්ත්‍රපති (කොරියාව)
බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

එම්. අමිලජිත් නිසංක ලීලාරත්න
කථිකාචාර්ය (ආධුනික)
ශාස්ත්‍රවේදී (කැලණිය), ශාස්ත්‍රපති (කොරියාව)
නූතන භාෂා අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

චතුරිකා විචන්ති දිද්දෙණිය
සහකාර කථිකාචාර්ය
ශාස්ත්‍රවේදී (කැලණිය), ශාස්ත්‍රපති (කොරියාව)
නූතන භාෂා අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ඩබ්. පී. සේකා කලණි වීරසිංහ
බාහිර කථිකාචාර්ය
ශාස්ත්‍රවේදී (කැලණිය), ශාස්ත්‍රපති (කොරියාව)
බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

**භාෂා සංස්කරණය :** ඩබ්. පී. මංගල ගුණරත්න

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ජාතික අධ්‍යාපන ආයතනය

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

2007 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ කනිෂ්ඨ හා ද්විතීයික ශ්‍රේණි සඳහා නිපුණතා පාදක විෂය මාලාවක් හඳුන්වා දී තිබේ. ඒ අනුව යමින් 2015 වසරේ දී ප්‍රථම වතාවට කොරියන් භාෂාව පාසල් විෂය මාලාවට හඳුන්වා දීමට හැකි වී ඇති අතර අනෙක් විෂයන් හා සමාන ව නිපුණතා පාදක විෂය නිර්දේශයක් යටතේ කොරියන් භාෂාව ද ඉගැන්වීමට ආරම්භ කරන ලදී. නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා මෙන්ම පුද්ගල හා සමාජ හැකියා යන සියල්ලේ ම එකතුවකි. නිපුණතාවක් අත්පත්කර ගැනීම යනුතමා විසින් ලබා ඇති දැනුම, ආකල්ප, කුසලතා සහ හැකියා ජීවිත කාලය පුරා භාවිතයට ගැනීමේ ශක්තියයි. ඒ අනුව මෙම විෂය නිර්දේශය සකස් කිරීමේ දී භාෂාවක් ඉගෙනීමෙන් පසු භාවිතයට ගැනීමේදී සිසුවකු අත් පත් කර ගත යුතු ප්‍රධාන නිපුණතාවයන් සැලකිල්ලට ගෙන ඇත. එක් නිපුණතාවක් ලබා ගැනීම සඳහා හැදෑරිය යුතු විෂය සන්ධාරය සහ එක් එක් වාරයට වෙන් කර ඇති කාල පරිච්ඡේද සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන සිසුන් ලඟා විය යුතු නිපුණතා මට්ටම් කිහිපයක් දක්වා ඇත. එක් එක් නිපුණතා මට්ටමකට ළඟා වීම සඳහා ශිෂ්‍යයකු විසින් ලබා ගන්නා දැනුම, ආකල්ප සහ කුසලතා ප්‍රදර්ශනය කල යුතු ආකාරය ඉගෙනුම් පල යටතේ සඳහන් කර ඇත. ඉගෙනුම් පලයක් යනු විෂය කොටසක් හෝ නිපුණතා මට්ටමකට ලඟා වීම සඳහා වන විෂය සන්ධාරය හදාරා අවසන් කළ පසු ශිෂ්‍යයා විසින් සාධනය කර ගනු ඇතැයි අපේක්ෂිත තත්වයයි. ශිෂ්‍යයාගේ සාධනය මැන බැලිය හැකි ආකාරයට ඉගෙනුම් පල දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතර දී හෝ අවසානයේ දී අපේක්ෂිත ඉගෙනුම් පල ශිෂ්‍යයා විසින් ලබා ගෙන තිබේ ද යන්න මැන බැලීම සඳහා ඇගයීම් හා තක්සේරු නිර්ණායක යොදා ගත යුතු ය.

12-13 ශ්‍රේණි සඳහා සකස් කර ඇති කොරියන් භාෂා විෂය නිර්දේශයේ එක් ශ්‍රේණියකට නිපුණතා 10 බැගින් ඇතුළත් කර ඇත. කාලපරිච්ඡේද සංඛ්‍යාව 10-11 ශ්‍රේණි වලට වඩා වැඩි බැවින් 12-13 ශ්‍රේණි වලදී කොරියන් භාෂාව හදාරන සිසුන්ට වඩාත් ගැඹුරට සහ සවිස්තරාත්මකව භාෂාව ඉගෙනීමේ අවස්ථාව හිමි වී ඇත. කෙසේ වුවද කොරියන් භාෂාව ඉගෙනීමට කැමැත්තක් දක්වන ඕනෑම සිසුවකුට 12 ශ්‍රේණියේදී කොරියන් භාෂාව මුල සිට හැදෑරීම ආරම්භ කල හැකිය. මෙම විෂය නිර්දේශයේ කොරියානු සංස්කෘතිය ඉගෙනීමට වැඩි කාල පරිච්ඡේද සංඛ්‍යාවක් වෙන් කර ඇත. එමෙන්ම කථනය, ශ්‍රවනය, කියවීම සහ ලිවීම යන මූලික භාෂා කුසලතා වලට අතිරේකව භාෂාව ප්‍රායෝගික භාවිතයට දිරි ගැන්වීම සහ ඒ සඳහා පුහුණුව ලබාදීමේ අරමුණින් කොරියන් භාෂා ව්‍යවහාරයන්, වාචික සහ ලිඛිත පරිවර්තන කුසලතාවය මෙන්ම රැකියා සඳහා අවශ්‍ය භාෂා ව්‍යවහාරයන් පිළිබඳ නිපුණතා කිහිපයක්ද ඇතුළත් කර ඇත.

12 ශ්‍රේණිය සඳහා සකස් කර ඇති විෂය නිර්දේශයේ පළමු වන නිපුණතාව යටතේ කොරියානු ජන සමාජය සහ සංස්කෘතිය හඳුන්වා දීමට අදාලව තෝරා ගත් විෂය සන්ධාරයක් ඇතුළත් කර ඇත. සංස්කෘතිය සම්බන්ධව සිසුන් දැනුවත් කිරීමේදී හැකි අන්තර්ජාලය ඇසුරින් හෝ හැකි පමණ සිසුන්ට කොරියානු සංස්කෘතිය සමීප කර වීමට උත්සාහ දැරිය යුතුයි. එමෙන්ම දෙවන නිපුණතාවය යටතේ කොරියන් භාෂාවේ ශබ්ද උච්චාරණය, අක්ෂර හඳුන්වා දීම සහ අක්ෂර ලිවීම පිළිබඳ ව ඇතුළත් කර ඇති ඇත. භාෂාවක් ඉගෙනීමේ දී එම භාෂාවට අනන්‍ය උච්චාරණ ක්‍රම පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ. වැරදි උච්චාරණයන්ට හුරු වීමෙන් පසු උච්චාරණ දෝෂ නිවැරදි කිරීම අපහසු බැවින් පන්ති කාමරය තුළ දී ම සිසුන්ගේ භාෂා උච්චාරණය පිළිබඳ සැලකිලිමත් වී නිවැරදි උච්චාරණය සහිත සංයුක්ත තැටි වලට හෝ

අන්තර්ජාලයේ ඒ සම්බන්ධ හඬ පටයන්ට සවන් දීම වැනි ක්‍රමෝපායන් භාවිත කර කොරියන් භාෂාවේ උච්චාරණය ග්‍රහණය කර ගැනීමට සිසුන්ට හැකි පමණ අවස්ථාව ලබා දිය යුතුය.

සන්නිවේදන කුසලතා ගොඩනගා ගැනිමට අවශ්‍ය වන මූලික ප්‍රකාශන ක්‍රම, ව්‍යාකරණ සහ වාක්‍ය රටා මෙන් ම දෛනික ජීවිතයේ දී භාවිත කිරීමට අත්‍යවශ්‍ය වචන මාලාව පිළිබඳ ව ද මෙහි දි සැලකිලිමත් වී ඇත. පෙළපොතේ විවිධ මාතෘකා යටතේ දී ඇති සංවාද ඇසුරින් සංවාද ගොඩ නගමින් පුහුණු වීමට සිසුන්ට අවස්ථාව දීම වැදගත් වේ. වචන මාලාව සහ ව්‍යාකරණ රටා මතක තබා ගැනිම පහසුවීම සඳහා විවිධ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සහ විනෝදාත්මක ක්‍රීඩා සැලසුම් කර ඉදිරිපත් කිරීමෙන් ඒ පිළිබඳ ව සිසුන්ගේ උනන්දුව වැඩිවේ. උගත් භාෂා ප්‍රකාශන ක්‍රම ප්‍රායෝගික භාවිතයට හුරු කිරීම සඳහා දෛනික ජීවිතයේ විවිධ අවස්ථා වලදි අවශ්‍ය වන පිරිසක් ඉදිරියේ කොරියන් බසින් කතාවක් පැවැත්වීම, කැමත් මාතෘකාවක් පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදු කිරීම, පිළිගැනීමේ කතාවක් හෝ ස්තුති කතාවක් කිරිම වැනි අවස්ථාවන්ට අදාළ ක්‍රියාකාරකම් සැලසුම් කිරිමෙන් සිසුන්ගේ භාෂා හැකියාව පමණක් නොව 21 වන සියවසට අවශ්‍ය අනෙකුත් මෘදු කුසලතාද සංවර්ධනය කර ගැනීමට අවස්ථාව ලැබේ.

මෙම මාර්ගොපදේශයේ සඳහන් උපදෙස් වලට සහ ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවී තමන්ගේ නිර්මාණශීලි අදහස් සහ කුසලතාවයන් ප්‍රයෝජනයට ගනිමින් ගුරුභවතන් තම පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කර ගනිතැයි අපේක්ෂා කරමි.


ආචාර්ය මධුභාෂිණී දෙල්දෙණිය

ව්‍යාපෘති නායක

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | iii |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | iv |
| 03 | විෂයමාලා කමිටුව | v |
| 04 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| 05 | පටුන | viii |
| 06 | විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix-xxxiii |
| 07 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-75 |
| 08 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 76-77 |

# කොරියන් භාෂාව

# විෂය නිර්දේශය

# 12 ශ්‍රේණිය

# හැඳින්වීම

වර්ෂ 1960 න් පසු ඇති වූ දකුණු කොරියාවේ ශීඝ්‍ර සංවර්ධනයත් සමග එරටෙහි ආර්ථිකයෙහි මෙන්ම ජීවින රටාවෙහි කැපී පෙනෙන වෙනස්කම් දක්නට ලැබුණි. ආර්ථික සංවර්ධනය අතින් ලෝකයේ 14 වන ස්ථානයට පත් දකුණු කොරියාව ආසියාව තුළ නව බලවතෙක් ලෙස හැන්ඳින්වීමට හැක. එම පසුබිම මත දකුණු කොරියාවට මෙන් ම කොරියානු භාෂාවට ලෝකය පුරා ඇත්තේ විශාල ඉල්ලුමකි. මේ වන විට කොරියානු භාෂාව මව් භාෂාව ලෙස භාවිතා කරන ජනගහනය ලොව පුරා මිලියන 70 ඉක්මවමින් සිටී. ශ්‍රී ලංකාව තුළද කොරියානු නාට්‍ය විකාශය වීමත් සමගම කොරියානු භාෂාව සහ සංස්කෘතිය ප්‍රචලිත විය. ශ්‍රී ලාංකිකයින් අතර විශේෂයෙන් ම තරුණ තරුණියන් අතර කොරියානු නාට්‍යය, පොප් සංගීතය, ආහාර පාන සහ ඇඳුම් පැළඳුම් ආදී සංස්කෘතික අංග අතිශයින් ජනප්‍රියත්වයට පත් විය.

මේ වන විට දකුණු කොරියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින්නේ ඉතා මිත්‍රශිලී අන්‍යෝන්‍ය සම්බන්ධතාවකි. කොරියානු රජය මගින් විවිධ අවස්ථාවලදී පුනර්ජනනීය බලශක්තිය, යටිතල පහසුකම් වැනි  ක්ෂේත්‍ර සඳහා ශ්‍රී ලංකාව වෙත ආධාර ලබා දෙන ලදී. එමෙන්ම සංස්කෘතික, අධ්‍යාපනික පුහුණු සහ කම්කරු යනාදී අංශවලටත් අඛණ්ඩ සහයෝගීතාව හිමි වෙමින් පවතියි. එමෙන්ම ශ්‍රී ලාංකිකයින් හට දකුණු කොරියාවේ රැකියා අවස්ථා සඳහා ද දොරටු විවර වී ඇත. මෙම හේතුන් මත පාසල් සිසුන් ලෙස කොරියානු භාෂාව හැදෑරීමෙන් සිය අනාගත සුභසිද්ධිය සලසා ගැනීමට හැකි වනු ඇත. මෙය ශ්‍රී ලාංකික උසස් පාසල් සිසුන් හට ලැබෙන හොඳ අවස්ථාවක් මෙන් ම නවතම අත්දැකීමක් වනු නිසැක ය.

මෙම විෂය නිර්දේශයේ ප්‍රධාන අරමුණ කොරියානු භාෂාව ඉගෙනීම තුලින් සන්නිවේදන කුසලතාවයන් ඔප්නැංවීමයි. ඒ සඳහා අවශ්‍ය කරන වාග්මාලාව හා ව්‍යාකරණ රටා පිළිබඳ මූලික දැනුමක් මේ හරහා ලබා ගත හැකි වනු ඇත. යම් රටක භාෂාවක් හා සංස්කෘතිය අතර පවතින්නේ ඉතා සමීප සම්බන්ධතාවයකි. එබැවින් මෙම විෂය නිර්දේශය තුලින් කොරියානු සමාජය හා සංස්කෘතිය පිළිබඳව ද පූර්ණ දැනුමක් ලබාගැනීමට අවස්ථාව හිමි වන අතර ඒ තුලින් ලෝකය තවත් පුළුල්ව දකින්නට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## කොරියන් භාෂාව විෂය අධ්‍යයනයේ අරමුණු

01. කොරියන් භාෂාව කතා කිරීම, ලිවීම, කියවීම හා ශ්‍රවණය යන චතුර්විධ කුසලතා සංවර්ධනය කිරීම මඟින් කොරියන් භාෂා ශක්‍යතාව ඇති කර ගැනීම.

02. කොරියන් භාෂක සමාජයට අයත් ජීවන රටාව සහ සමාජ සංස්කෘතික හර පද්ධතීන් හඳුනා ගෙන අගය කිරීම, සංස්කෘතික අනන්‍යතාවයන්ට ගරු කිරීම සහ අන්‍ය සංස්කෘතීන් තුළ අන්තර්ගත වටිනාකම් ජීවිතයට එක් කර ගැනීම සහ කොරියන් ජාතිකයන් සමඟ සම්බන්ධතා ගොඩනඟා ගැනීම.

03. භාෂා ඉගෙනීම තුළින් සාහිත්‍යයික, විද්‍යාත්මක හා සමාජීය දැනුම වර්ධනය කර ගනිමින් වෙනස් වන ලෝකය සමඟ කටයුතු කිරීමේ හැකියාව ලබා ගැනීම.

04. තිරසර ජීවනෝපායකට අවශ්‍ය මූලික කුසලතා සංවර්ධනය කර ගනිමින් දේශීය ආර්ථීක සංවර්ධනයට සහාය වීම.

05. සන්නිවේදන කුසලතාවය ඔප් නංවා ගැනීම තුළින් ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ අභිමානවත් ලෙස කටයුතු කිරීමේ හැකියාව ලබා ගැනීම.

06. විචාරශීලී චින්තනය, රසාස්වාදය, නිර්මාණාත්මක හැකියාව මඟින් සමබර පෞරුෂයක් ඇති කර ගැනීම සහ වැඩ ලෝකයට උචිත කුසලතාවයන් සංවර්ධනය කර ගැනීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01. කොරියානු ජන සමාජය, සංස්කෘතිය හා ජීවන රටාව පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරයි. | 1.1 කොරියාවේ භූගෝලීය පිහිටීම ආශ්‍රිත මූලික දැනුම කොරියානු ජන සමාජය හා සංස්කෘතිය අවබෝධ කර ගැනීමේ දී භාවිත කරයි.<br>1.2 කොරියානු ජාතිකයින්ගේ ආචාර ක්‍රම හා එක් එක් අවස්ථාවන්ට ගැළපෙන ආචාර පද භාවිත කරයි.<br>1.3 කොරියානු ජන සමාජයට අයත් විවිධ සංස්කෘතික අංග සහ ඒ හා බැඳුණු සමාජ හා ඓතිහාසික පසුබිම පිළිබඳ දැනුම සහිතව භාෂාව භාවිත කරයි.<br>1.4 කොරියානු සංස්කෘතික අනන්‍යතාවය හඳුනා ගෙන කොරියානු සංස්කෘතිමය වටිනාකම් අවශ්‍ය අවස්ථා වලදී ජීවිතයට එක් කර ගනියි, | 12 ශ්‍රේණියේ පෙළ පොතේ නිර්දේශිත මාතෘකා<br>• 한국의 상징<br>• 한국의 명절<br>• 한국의 가족 호칭<br>• 한국의 인사법<br>• 한국의 상차림<br>• 한국의 축제<br>• 한국의 전통 시장<br>• 한국의 대표 음식 | • කොරියාවේ පිහිටීම නිවැරදිව හඳුනා ගෙන ලෝක සිතියමක ලකුණු කරමින් භූ ගෝලීය පිහිටීම පැහැදිලි කරයි,<br>• කොරියාවේ භූගෝලීය පිහිටීම කොරියානු ජන සමාජය හා සංස්කෘතිය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ සරල ව පැහැදිලි කරයි.<br>• උගත් ආචාර පද අවස්ථාවන්ට අනුකූලව නිවැරදිව භාවිතයේ යොදයි.<br>• කොරියානු ජන සමාජයට අදාළ විවිධ සංස්කෘතික අංග හා එහි සුවිශේෂතා පිළිබඳව පැහැදිළිව විස්තර කරයි.<br>• කොරියානු සමාජ සංස්කෘතික හා ජනජීවිතයට අදාළ කරුණු ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා සංසන්දනය කරමින් ඉදිරිපත් කිරීම කරයි.<br>• කොරියානු සමාජ සංස්කෘතික හා ජන ජීවිතයට අදාළ විවිධ සංස්කෘතික අංග පිළිබඳ තම අදහස් ඉදිරිපත් කරයි.<br>• කොරියානු සංස්කෘතියට අදාළ තොරතුරු එක් රැස් කර කොරියානු සංස්කෘතිකාංග ප්‍රතිනිර්මාණය කර ප්‍රදර්ශනය කරයි.<br>• අනෙකුත් සංස්කෘතීන්ට ගරු කරයි,<br>• කොරියානු සංස්කෘතිකාංග පිළිබඳ අත්දැකීම් ලබා ඇති සිසුන් සමග ඒ පිළිබඳ අදහස් බෙදා ගනියි, | 29 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 02. ශබ්ද උච්ඡාරණය, උච්ඡාරණ රීති සහ කොරියානු අක්ෂර හඳුනා ගෙන භාවිත කරයි. | 2.1 කොරියන් අක්ෂර මාලාව සම්බන්ධ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කරයි.<br><br>2.2 ස්වර සහ ව්‍යඤ්ජනවලට සවන් දී ඒ අනුව උච්ඡාරණය කරයි,<br><br>2.3 නිවැරදි පියවර අනුගමනය කරමින් අක්ෂර ලියයි.<br><br>2.4 ස්වර සහ ව්‍යඤ්ජන සම්බන්ධ කිරීමේ රීතීන්වලට අනුව මාත්‍රා ගොඩනගයි,<br><br>2.5 නිවැරදි උච්ඡාරණය සඳහා දැනගත යුතු උච්ඡාරණ රීතීන් හඳුනා ගෙන උච්ඡාරණය කරයි. | ● කොරියන් අක්ෂර මාලාව නිර්මාණය වීමට පෙර කොරියානු ජාතිකයින්ගේ සාක්ෂරතාව පිළිබඳ පසුබිම<br>● අක්ෂර මාලාව බිහිවීමට බලපෑ කරුණු සහ එහි නිර්මාතෘ සෙජෝන් අධිරාජ්‍යයා පිළිබඳ හැඳින්වීම<br>● ස්වරාක්ෂර නිර්මාණයට පාදක වූ සංකේත<br>● ස්වර - මූලික ස්වර 10<br>- සංයුක්ත ස්වර 11<br>● ව්‍යඤ්ජන - ව්‍යඤ්ජන 14<br>- ද්විත්ව ව්‍යඤ්ජන 5<br>● අක්ෂර ලිවිය යුතු නිවැරදි පියවර<br>● උච්ඡාරණ ඉන්ද්‍රියයන් මඟින් ශබ්ද උත්පාදනය වන ආකාරය<br>● ස්වර සහ ව්‍යඤ්ජන එක්ව නිර්මාණය වන ශබ්ද උච්චාරණය<br>● අවසාන ව්‍යඤ්ජනාක්ෂර ස්ථානයේ යෙදෙන ව්‍යඤ්ජන සහ ඒ හා සම්බන්ධ උච්චාරණ නීති<br>● වචන උච්චාරණයට අදාළ ව්‍යතිරේක කරුණු<br>● අක්ෂර සංයෝග කර වචන ලිවීම සම්බන්ධ රීති. | ● කොරියන් අක්ෂර මාලාව බිහිවීමට බලපෑ ඓතිහාසික පසුබිම විස්තර කරයි.<br>● කොරියන් අක්ෂර නිර්මාණය කිරීමෙහි ලා පුරෝගාමී වූ 'සෙජොන්' රජු ගැන විස්තර කරයි.<br>● ස්වර සහ ව්‍යඤ්ජන උච්ඡාරණයට සවන් දී ඒවා නිවැරදිව උච්ඡාරණය කරයි.<br>● මූලික ස්වර සහ සංයුක්ත ස්වර අතර වෙනස දක්වයි.<br>● ස්වර සහ ව්‍යඤ්ජන ශබ්ද උච්ඡාරණ විවිධතා පැහැදිලි වන ලෙස උච්ඡාරණය කරමින් අභ්‍යාසයේ යෙදෙයි.<br>● එක් එක් උච්චාරණ ඉන්ද්‍රියයන් මඟින් උත්පාදනය වන ශබ්ද වර්ග කර දක්වයි,<br>● ස්වර හා ව්‍යඤ්ජන අක්ෂර රේඛා අනුපිළිවෙළට ලියයි.<br>● ස්වර හා ව්‍යඤ්ජන සංයෝග කොට නිවැරදිව වචන ගොඩනගයි.<br>● හල් කිරීමට අදාළ නීති රීතිවලට අනුව හල්කිරීමේ ශබ්ද නිවැරදිව උච්චාරණ කරයි.<br>● ව්‍යඤ්ජන හා ස්වර සන්ධි වීමේ රීතීන්ට අනුව නිවැරදිව උච්චාරණ කරයි.<br>● ප්‍රකාශිත වාක්‍ය හා ප්‍රශ්නාර්ථ වාක්‍ය අවසානයේ තානයට අනුව හඬ පාලනය කරමින් කතා කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 03. සවන් දී ප්‍රතිචාර දක්වයි. | 3.1 එදිනෙදා ජීවිතයේදී නිතර භාවිත වන යෙදුම්වලට සවන් දී අවබෝධ කරගෙන නිවැරදිව ප්‍රතිචාර දක්වයි.<br><br>3.2 එදිනෙදා ජීවිතය හා සම්බන්ධ මූලික සංවාද අවස්ථාවන්ට සවන්දී අවබෝධ කරගෙන නිවැරදිව ප්‍රතිචාර දක්වයි. | • ආචාර කිරීම, ස්තුති කිරීම<br>• තමාව හඳුන්වා දීම<br>• සමාව ගැනීම<br>• ස්ථාන හඳුන්වා දීම<br>• සංඛ්‍යා හඳුන්වා දීම<br>• වෙලාව පැවසීම<br>• එදිනෙදා කටයුතු පිළිබඳ හැදින්වීම<br>• සති අන්තය, නිවාඩු කාලයට අදාළ සැලසුම් පිළිබඳ කතා කිරීම.<br>• භාණ්ඩ මිලදී ගැනීම<br>• කාලගුණය විස්තර කිරීම<br>• අණ කිරීම<br>• රස විස්තර කිරීම<br>• ආහාර ඇනවුම් කිරීම<br>• නිවේදන | • ආචාර කිරීම්, ස්තුති කිරීම්, සමාව ගැනීම්, අණ කිරීම්, උපදෙස් යනාදී අවස්ථාවලට අදාළ යෙදුම්වලට සවන් දී අවස්ථානුකූලව ප්‍රතිචාර දක්වයි.<br>• දෛනික හා විධිමත් සංවාදවලට සවන් දී අවශ්‍ය තොරතුරු අවබෝධ කරගෙන ප්‍රශ්න ඇසීම හා පිළිතුරු දීම සිදු කරයි.<br>• සංවාදයේ ඇතුළත් තොරතුරු සංක්ෂිප්තව ඉදිරිපත් කරයි.<br>• සවන් දී තොරතුරු අවබෝධ කර ගෙන උපදෙස් අනුව කටයුතු කරයි. | 26 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 04. ව්‍යාකරණ රටා අවස්ථානුකූලව නිවැරදිව භාවිත කරයි. | 4.1 ව්‍යාකරණ රටාවල ස්වරූපය, අර්ථය සහ භාවිත වන අවස්ථා අධ්‍යයනය කර නිවැරදි වාක්‍ය ගොඩ නගයි.<br><br>4.2 දෛනික කටයුතුවලදී භාෂා ප්‍රකාශනය සඳහා උපයෝගී වන ව්‍යාකරණ රටා අවස්ථානුකූලව භාවිත කරයි.<br><br>4.3 සමාන ලක්‍ෂණ පෙන්නුම් කරන ව්‍යාකරණ රටා වල පවතින වෙනස්කම් අවබෝධ කර ගනිමින් අවස්ථානුකූලව භාවිත කරයි. | • නිපාත පද<br>• ගණනය කිරීමේ ඒකක<br>• ප්‍රශ්නවාචක පද<br>• අතීත,වර්තමාන,අනාගත කාල දක්වන ව්‍යාකරණ රටා<br>• 'නැත' යන අර්ථය හා 'නොහැකියාව' දක්වන ව්‍යාකරණ රටා<br>• 'හේතු' අර්ථය දක්වන ව්‍යාකරණ රටා<br>• විධානය හඟවන ව්‍යාකරණ රටා<br>• වාක්‍ය සම්බන්ධීකාරක ව්‍යාකරණ රටා<br>• භාෂාවේ විධිමත් සහ අවිධිමත් ස්වරූපය<br><br>වැඩි විස්තර සඳහා ව්‍යාකරණ ඇමුණුම 1 බලන්න | • උගත් ව්‍යාකරණ රටා ව්‍යතිරේකව යෙදෙන අවස්ථා පිළිබඳව සැලකිලිමත් වෙමින් ඒවා නිවැරදිව වාක්‍යවල යොදයි.<br>• ව්‍යාකරණ රටාවල අර්ථය පැහැදිලි වන අයුරින් අර්ථවත් සරල වාක්‍ය නිර්මාණය කරයි.<br>• උගත් සම්බන්ධීකාරක ව්‍යාකරණ රටා නිවැරදිව යොදා ගනිමින් වාක්‍ය සම්බන්ධ කරයි.<br>• නාම පද හා ගණනය කිරීමේ ඒකක නිවැරදිව ගළපා ගනිමින් ගණනය කරයි.<br>• නිපාත පද, කාල භේදය, වාක්‍ය සම්බන්ධ කිරීම, වාක්‍ය අවසන් කිරීම ආදී ව්‍යාකරණ රටා සහ යෙදුම් අවස්ථානුකූලව භාවිත කර භාෂා ප්‍රකාශනයේ යෙදෙයි.<br>• භාෂාවේ විධිමත් සහ අවිධිමත් ස්වරූපය අවස්ථා අනුව භාවිත කරමින් වාක්‍ය ගොඩ නගයි.<br>• සමාන ලක්ෂණ ඇති ව්‍යාකරණ රටා අවස්ථානුකූලව නිවැරදිව භාවිතා කරයි. | 100 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 05. නිවැරදිව හා නිරවුල්ව සන්නිවේදනයේ යෙදෙයි | 5.1 දෛනික ජීවිතයට අවශ්‍ය තොරතුරු සහ අදහස් හුවමාරු කර ගනිමින් සංවාදයේ යෙදෙයි.<br><br>5.2 දෙන ලද විවිධ මාතෘකා ඇසුරින් සරල කතා ඉදිරිපත් කරයි. | විවිධ භාෂා යෙදුම්<br>● ආචාර කිරීම<br>● තමාව හඳුන්වා දීම<br>● ස්ථාන හඳුන්වාදීම<br>● වෙලාව පැවසීම<br>● එදිනෙදා කටයුතු පිළිබඳ හැඳින්වීම<br>● සති අන්තය,<br>● නිවාඩු කාලයට අදාළ සැලසුම්<br>● කාලගුණය විස්තර කිරීම<br>● අණ කිරීම<br>● භාණ්ඩ මිලදී ගැනීම<br>● රස විස්තර කිරීම<br>● ආහාර ඇනවුම් කිරීම | ● සාමාන්‍ය ජීවිතයේ නිතර භාවිත වන ආචාර දැක්වීම, ස්තුති කිරීම, සමාව ගැනීම යනාදී අවස්ථාවලට අදාළ යෙදුම් සන්නිවේදනය සඳහා නිවැරදිව භාවිත කරයි.<br>● පෞද්ගලික තොරතුරු ඉදිරිපත් කරමින් තමා හඳුන්වා දෙයි.<br>● දෛනික කටයුතු පිළිබඳ ව ප්‍රශ්න අසයි.<br>● දෛනික කටයුතු පිළිබඳ ව අසන ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු දෙයි.<br>● තම දින චර්යාව විස්තර කරයි.<br>● කාලගුණය/දේශගුණය සරලව විස්තර කරයි,<br>● සරලව එක් වාක්‍යයකින් විධානයක් දක්වයි.<br>● තමා අවට ඇති දෙයක්, කෙනෙක් හෝ පින්තූරයක් බලා ඉතා සරලව ඒ පිළිබඳව විස්තර කරයි.<br>● දෛනික කටයුතු පිළිබඳ කෙටි දෙබස්, සංවාද වල යෙදෙමින් තොරතුරු හා අදහස් හුවමාරු කර ගනියි.<br>● තමා හා සමීප වටපිටාවට අදාළ මාතෘකා සම්බන්ධයෙන් වැකි කිහිපයකින් විස්තර කරයි.<br>● විවිධ අවස්ථාවන් පිළිබඳව තම අත්දැකීම් විස්තර කරයි. | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 06. අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි. | 6.1 වචන හා වාක්‍ය නිවැරදිව කියවයි.<br>6.2 කියවා අවබෝධ කරගනියි<br>6.3 කියවා තොරතුරු සාරාංශ ගත කරයි. | ● සුබ පැතුම් පණිවිඩ<br>● ලිපි<br>● විද්‍යුත් ලිපි<br>● සංවාද<br>● ඡේද<br>● රචනා<br>● දැන්වීම් හා සංඥා පුවරු | ● වචන සහ වාක්‍ය ඛණ්ඩ අවශ්‍ය තැන්වල දී නිවැරදිව වෙන් කර කියවයි.<br>● හඬ හා අක්ෂර වෙනස් වන ස්ථාන හඳුනා ගෙන නිවැරදිව කියවයි.<br>● වාක්‍ය නිවැරදිව කියවයි.<br>● වාක්‍ය, ඡේද, රචනා සහ සංවාද නිවැරදිව ශබ්ද නගා කියවයි.<br>● දෛනික ජීවිතයට අදාළ සුබ පැතුම් පණිවිඩ, ලිපි සහ විද්‍යුත් ලිපි ආදිය අන්තර්ගතය අවබෝධ කරගනිමින් කියවයි<br>● සරල ඡේද, ලිපි, රචනා , දැන්වීම් යනාදී ඇසුරෙන් අසන ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයයි.<br>● සරල ඡේද, ලිපි, රචනා, දැන්වීම් ආදිය කියවා උපුටා ගත් තොරතුරු සාරාංශ ගත කරයි.<br>● ඡේද, ලිපි යනාදිය කියවා සරල වාක්‍ය කීපයකින් ඒ පිළිබඳව අදහස් දක්වයි. | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 07. ලිඛිතව අදහස් ප්‍රකාශ කරයි. | 7. 1 අදහස් ක්‍රමානුකූලව පෙළගස්වමින් ව්‍යාකරණානුකූලව සහ අර්ථාන්විතව ලියයි<br><br>7. 2 ලිඛිතව අදහස් හුවමාරු කරගනියි. | • සුබ පැතුම් පණිවිඩ<br>• ලිපි<br>• විද්‍යුත් ලිපි<br>• සංවාද<br>• රචනා<br>• දැන්වීම්<br>• කතන්දර<br>• දිනපොත්<br>• පින්තූර | • නිවැරදි අක්ෂර වින්‍යාසයට අනුව වාක්‍ය ලියයි.<br>• දෙන ලද වාක්‍ය රටාවකට අනුව ව්‍යාකරණානුකූල සහ අර්ථාන්විත සරල වාක්‍ය ගොඩ නඟයි.<br>• ලිපි, විද්‍යුත් ලිපි, කෙටි පණිවිඩ සහ දැන්වීම් යනාදිය සකස් කර අදහස් සහ තොරතුරු හුවමාරු කර ගනියි.<br>• දෙන ලද මාතෘකා යටතේ අදහස් ක්‍රමානුකූලව පෙළ ගස්වමින් සරල රචනා සහ කතන්දර ලියයි.<br>• තම දින චර්යාව දින පොතක සටහන් කරයි,<br>• දෙන ලද පින්තූර බලා සරල වාක්‍ය ඇසුරෙන් කතාවක් ගොඩනගයි, | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 08. කොරියානු සාහිත්‍ය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනිමින් රසාස්වාදයේ යෙදෙයි. | 8.1 කොරියානු ජන සාහිත්‍යය හා නූතන සාහිත්‍යය බිහිවීමෙහිලා බලපෑ සමාජ පසුබිම හා එහි සුවිශේෂී ලක්‍ෂණ අවබෝධ කර ගනිමින් සාහිත්‍ය නිර්මාණ රස විඳියි .<br><br>8.2 කොරියානු සාහිත්‍ය නිර්මාණ කියවා ඉන් ගම්‍ය වන අර්ථය සහ සුවිශේෂී ලක්ෂණ විශ්ලේෂණය කරයි.<br><br>8.3 සාහිත්‍ය නිර්මාණ කියවා රසාස්වාදය කර තම අදහස් ඉදිරිපත් කරයි. | • ජන කතා<br>- 소가된 게읍름뱅이<br>• පද්‍ය<br>- 엄마야 누나야<br>• කොරියානු සාහිත්‍යයේ පුරෝගාමී චරිත<br>- 이광수<br>- 김소월 | • කොරියානු ජන සාහිත්‍යය හා නූතන සාහිත්‍යය බිහි වීමෙහි ලා බලපෑ සමාජ පසුබිම විස්තර කරයි.<br>• කොරියානු ජන හා නූතන සාහිත්‍යයේ සුවිශේෂී ලක්‍ෂණ ලැයිස්තුගත කර ප්‍රකාශ කරයි.<br>• සාහිත්‍යය නිර්මාණ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයයි.<br>• උගත් සාහිත්‍ය නිර්මාණ සාරාංශ ගත කරයි.<br>• උගත් ජන කතා ඇසුරෙන් සරල කොරියන් බසින් පිටපත් ලියා නාට්‍ය රඟ දක්වයි.<br>• සාහිත්‍ය නිර්මාණයක රසය සාමූහිකව විචාරශීලිව සාකච්ඡා කරයි.<br>• කොරියානු නූතන සාහිත්‍යයේ පුරෝගාමී චරිත සහ ඔවුන්ගේ නිර්මාණ නම් කරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 09. කොරියන් භාෂා ව්‍යවහාර හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | 9.1 දෛනික ජීවිතයේ විවිධ අවස්ථා හඳුනා ගෙන උචිත පරිදි භාෂාව නිවැරදිව හසුරුවයි. | දෛනික ජීවිතයේ විවිධ අවස්ථා<br>● ඉදිරිපත් කිරීමක දී<br>● පිරිසක් ඉදිරියේ ඇමතීමේ දී<br>● සම්මුඛ පරීක්ෂණයක දී<br>● නිවේදන කටයුතුවලදී | ● උචිත භාෂා යෙදුම් සහ අංග චලන උපයෝගී කර ගනිමින් කොරියන් බසින් ඉදිරිපත් කිරීම් සිදු කරයි.<br>● සුදුසු භාෂා යෙදුම් භාවිත කරමින් පිරිසක් ඉදිරියේ කතාවක් පවත්වයි.<br>● පිළිගැනීමේ කතාවක් ඉදිරිපත් කරයි.<br>● රැස්වීමක්/උත්සවයක් අවසානයේ ස්තුති කතාවක් ඉදිරිපත් කරයි.<br>● උචිත කොරියන් භාෂා යෙදුම් සහ හැසිරීම් පිළිබඳව සැලකිලිමත් වෙමින් පෙරහුරු සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වෙයි.<br>● උත්සවයක නිවේදන කටයුතු සිදු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10. නිවැරදිව හා නිරවුල්ව පරිවර්තනය කරයි. | 10.1 පරිවර්තනය කරනු ලබන හා පරිවර්තනයට ලක් වන භාෂාවල ආවේණික ලක්‍ෂණ සහ සමාන අසමානතා පිළිබඳව අවබෝධයෙන් යුතුව පරිවර්තනය කරයි.<br><br>10.2 කොරියන් බසින් සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි.<br><br>10.3 සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි බසින් කොරියන් භාෂාවට පරිවර්තනය කරයි. | ● ලිඛිත පරිවර්තනය<br>- වාක්‍ය<br>- වාක්‍ය ඛණ්ඩ<br>- ඡේද<br>- ලිපි | ● පරිවර්තනය කරනු ලබන භාෂාවට ආවේණික ලක්ෂණ සහ භාෂාත්මක විශේෂතා ආරක්ෂා කර ගනිමින් පරිවර්තනය කරයි.<br>● ලිඛිත පරිවර්තනයේදී අනුගමනය කළ යුතු රීතිවලට අනුකූලව පරිවර්තනය කරයි.<br>● එම ලක්‍ෂණවලට අදාළව පරිවර්තනයේ යෙදෙයි.<br>● කොරියන් බසින් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි.<br>● සිංහල/දෙමළ/ඉංග්‍රීසි බසින් කොරියන් භාෂාවට පරිවර්තනය කරයි.<br>● ලබාදී ඇති ඡේද, ලිපි, දැන්වීම් යනාදියේ අර්ථය, ආචාර විධි, යෙදුම්, ප්‍රකාශන ආදියට හානියක් නොවන සේ පරිවර්තනය කරයි. | 14 |

ඇමුණුම 1 - ව්‍යාකරණ

**1.** නිපාත පද

- 은/는
- 이/가
- 에
- 의
- 하고
- 와/과
- (이)랑
- 을/를
- 에서
- (으)로
- 도
- 만
- 이에요/예요, 입니다
- 부터/에서~까지
- 보다
- 에게/한테
- 에게(서)/한테(서)
- 마다
- -이나

2. වර නැගීමේ පද

- -았/었
- - (으)시
- -겠

3. වාක්‍ය අවසන් කිරීමේ පද

- - 아요/어요
- - 습니다/ㅂ니다
- - (으)세요
- - 읍시다
- - 을까요?
- (으)ㄹ게요
- -(으)ㄹ래요?
- 반말(비격식체)
- -지요
- -(으)십시오

4. සම්බන්ධීකාරක පද

- - 고
- - 지만
- - 아/어서
- - (으)러 가다/오다
- - (으)면
- - (으)려고
- - (으)니까
- - 는데/(으)ㄴ데
- - (으)ㄴ(상태) ,
- - 는(동작) (으)ㄴ(동작)
- - (으)ㄹ(동작)
- - (으)려고 하다
- - 거나

5. යෙදුම්

- - 이/가 아니에요
- - 고 싶다
- - 고 있다
- - 안/지 않다
- - 못/지 못하다
- - 아야/어야 하다
- -(으)ㄴ 후에
- -기 전에
- - 아/어 본 적이 있다/없다
- - (으)ㄴ/는/(으)ㄹ 것 같다
- -기 때문에, 때문에
- - (으)ㄹ 때
- -아/어 보다(경험)
- -지 말다

- - (으)ㄹ 거예요(미래)
- - 아/어 주세요
- - (으)ㄹ 수 있다/없다,
- - 아도/어도 되다
- - (으)면 안 되다
- - 았/었으면 좋겠다

- **උච්ඡාරණ නීති**
  - ‘으’ 탈락
  - ‘ㅂ’불규칙
  - ‘ㄷ’ 불규칙
  - ‘ㄹ’ 탈락
  - ‘르’ 불규칙

**03 නිර්දිෂ්ට ග්‍රන්ථ (අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට නියමිත)**

- Hangukgo I - 12 ශ්‍රේණිය සඳහා (ඉදිරියේ දී මුද්‍රණය කිරීමට නියමිතය)
- Hangukgo II - 13 ශ්‍රේණිය සඳහා (ඉදිරියේ දී මුද්‍රණය කිරීමට නිමිතය)

## 04. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද

- දේශන
- පැවරුම්
- තේවල /කණ්ඩායම් ක්‍රියාකාරකම්
- විනෝදාත්මක ක්‍රීඩා
- තේවල /කණ්ඩායම් ඉදිරිපත් කිරීම්
- සාකච්ඡා

## 05. පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

ඃ කොරියන් බසින් කෙරෙන නිර්මාණ ප්‍රදර්ශනය කිරීම සඳහා බිත්ති පුවත්පතක් පවත්වා ගෙන යෑම

ඃ විවිධ භාෂා ඉගෙනුම ලබන සිසුන්ගේ සාමූහිකත්වයෙන් මාසික සඟරාවක් සකස් කිරීම

ඃ නාට්‍ය, ප්‍රදර්ශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ තරග පැවැත්වීම

ඃ කොරියාවේ සංස්කෘතික අංග මුල් කර ගෙන විශේෂ වැඩ සටහන් සංවිධානය කිරීම

ඃ කොරියන් භාෂා දිනයක් පැවැත්වීම

## 06. තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මකව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය. ඉගෙනුම් කාර්යයේදී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලයන්ගේ ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් පල වලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදුවේ. මුල දී තීරණය කරගත් නිර්ණායක සමඟ සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ළමයා සාක්ෂාත් කරගෙන තිබේදැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධානය කළ යුතුය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේශණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතරව ඇගයීම් වැඩ පිළිවෙළ යනු ශිෂ්‍යයාගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම යි, ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කරගත් ශ්‍රේණී හා ලකුණු සසඳා ඔවුන්ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

**නිපුණතාව** 1.0 කොරියානු ජන සමාජය, සංස්කෘතිය හා ජීවන රටාව පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 1.1 කොරියාවේ භූගෝලීය පිහිටීම ආශ්‍රිත මූලික දැනුම කොරියානු ජන සමාජය හා සංස්කෘතිය අවබෝධ කර ගැනීමේ දී භාවිත කරයි.

**කාලච්ඡේද** 04

**ඉගෙනුම් පල**

- කොරියාවේ පිහිටීම නිවැරදි ව හඳුනා ගෙන ලෝක සිතියමක ලකුණු කරමින් භූගෝලීය පිහිටීම පැහැදිලි කරයි.

- කොරියාවේ භූගෝලීය පිහිටීම කොරියානු ජන සමාජය හා සංස්කෘතිය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ සරල ව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- කොරියාව පිළිබඳ තමන් දන්නා තොරතුරු ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ලෝක සිතියමක කොරියාව සහ කොරියාවට ආසන්නයේ පිහිටි රටවල් හඳුනා ගෙන ලකුණු කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- කොරියානු අර්ධද්වීපයේ සිතියම ආධාර කර ගනිමින් එහි භූගෝලීය පිහිටීම පිළිබඳ දළ අවබෝධයක් ලබා දෙන්න.
- උතුරු කොරියාව සහ දකුණු කොරියාව ලෙස බෙදී වෙන් ව ඇති ආකාරය, ඊට පසුබිම් වූ කරුණු සහ පහත කරුණු ඔස්සේ කෙටියෙන් සාකච්ඡා කරන්න.
  - උතුරු කොරියාවේ සහ දකුණු කොරියාවේ අග නගර සහ එහි පිහිටීම
  - දකුණු කොරියාවේ පළාත්, ප්‍රධාන නගර (광역시 예 부산ල 대구ල 인천ල광주)
  - එක් එක් පළාතට අදාළ උප භාෂා, ආහාර, නගර යනාදියේ විශේෂතා පිළිබඳ හඳුන්වා දෙන්න.
- කොරියාවේ භූවිෂමතා ලක්ෂණ පිළිබඳව අන්තර්ජාලය සහ පින්තූර ඇසුරින් පහත එක් (

  එක් කරුණු ඔස්සේ දළ අවබෝධයක් ලබා දෙන්න.

  - තැනිතලා බිම් (30%) සහ කඳු බිම් (70%)
  - ප්‍රධාන කඳු (백두산, 지리산, 한라산, 설악산)/කොරියානු අර්ධද්වීපයේ විශාලතම කන්ද

  백두산 සහ දකුණු කොරියාවේ විශාලතම කන්ද 한라산

- ප්‍රධාන දූපත් (제주도, 울릉도, 거제도, 진도, 독도) / විශාලතම දූපත වන ජේජු දූපතෙහි පිහිටීම
- ප්‍රධාන ගංගා (한강, 금강, 낙동강)ඍතු (봄, 여름, 가을, 겨울)

• දකුණු කොරියාවේ පරිපාලන ව්‍යුහය හා එක් එක් පළාතට අදාළ උප භාෂා, ආහාර, නගර යනාදි විශේෂතා පිළිබඳ හඳුන්වා දෙන්න.

- දකුණු කොරියාවේ පරිපාලන ව්‍යුහය ප්‍රධාන වශයෙන් ප්‍රධාන නගර හා පළාත් වශයෙන් බෙදී යයි.
- එසේම එක් එක් පළාත්වලට අනුව උපභාෂා භාවිත වීම ද පළාත් වශයෙන් දැකිය හැකි තවත් සුවිශේෂ ලක්ෂණයකි. (예: 경상도 사투리, 전라도 사투리, 제주도 사투리 ).
- පහත කරුණු පිළිබඳව සාකච්ඡා කරන්න.

| | | | |
|---|---|---|---|
| 서울 | • කොරියාවේ පවතින විවිධ භාෂා ව්‍යවහාර අතුරින් සෞල් නුවර භාෂාව සම්මත භාෂා ව්‍යවහාරය ලෙස භාවිත වේ.<br>• ක්යෝන්ග්බුක් මාලිගය, හන්ගඟ, නම්දෙමුන් වෙළඳපොල සෞල් නුවර සුප්‍රසිද්ධ ස්ථානයි. | 경기도 | සුවොන් මේ පළාතේ ප්‍රධාන නගරයකි.<br>화성 ප්‍රකාරය පිහිටා ඇත්තේ මේ පළාතේ ය. |
| 부산 | • කොරියාවේ දෙවෙනි විශාලතම නගරයයි.<br>• වෙළඳ කටයුතු සඳහා ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරයි. | 강원도 | • දකුණු කොරියාවේ ඉහළින් ම පිහිටා ඇති පළාත වන බැවින් ශිතාධික කාලගුණයක් පවතී.<br>• අලංකාර කඳු වැටියක් වන සොරක් කන්ද මෙහි පිහිටා ඇත |
| 울산 | • කර්මාන්ත පුරවරයක් ලෙස ප්‍රසිද්ධ වේ. (උදා: නැව් හා වාහන කර්මාන්ත ) | 충청도 | • මෙම පළාතේ පිහිටා ඇති චුන්ජු නගරය ඇපල්වලට ප්‍රසිද්ධ ය. |

| | | | |
|---|---|---|---|
| | | | • උප භාෂා ව්‍යවහාර අතරින් වඩාත්ම මෘදු භාෂා ව්‍යවහාර පවතින්නේ මේ පළාතේ ය. |
| 강원도 | • දකුණු කොරියාවේ ඉහළින් ම පිහිටා ඇති පළාත වන බැවින් ශීතාධික කාලගුණයක් පවතී.<br>• අලංකාර කඳු වැටියක් වන සොරක් කන්ද මෙහි පිහිටා ඇත | 경상도 | • ඓතිහාසික වශයෙන් වැදගත්කමක් ඇති 경주 නගරය පිහිටා ඇත්තේ මෙම පළාතේ වේ.<br>• 경주 නගරය යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස නම් කර ඇති ඉපැරණි බෞද්ධ නගරයකි. |
| 경상도 | • ඓතිහාසික වශයෙන් වැදගත්කමක් ඇති 경주 නගරය පිහිටා ඇත්තේ මෙම පළාතේ වේ.<br>• 경주 නගරය යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස නම් කර ඇති ඉපැරණි බෞද්ධ නගරයකි. | 전라도 | • කොරියාවේ පහළින් ම පිහිටා ඇති පළාතයි.<br>• කොරියාවේ ප්‍රණීතම ආහාර සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. (උදා: විවිධ මුහුදු ආශ්‍රිත ආහාර) |
| 전라도 | • කොරියාවේ පහළින් ම පිහිටා ඇති පළාතයි.<br>• කොරියාවේ ප්‍රණීතම ආහාර සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. (උදා: විවිධ මුහුදු ආශ්‍රිත ආහාර) | 제주도 | • කොරියාවේ විශාලම දූපතයි.<br>• සෞම්‍ය දේශගුණයකින් යුතු වේ.<br>• සෞම්‍ය දේශගුණය හා ස්වභාව සෞන්දර්යයෙන් අනූන වුයෙන් ඉහළ සංචාරක ආකර්ෂණයක් ලබා ඇත.<br>• ප්‍රසිද්ධ හල්ලා කඳු වැටිය මෙහි පිහිටා ඇත. |

• භූගෝලීය වශයෙන් කොරියාවට යාබදව පිහිටා ඇති චීනය සහ ජපානය හරහා කොරියානු ජන සමාජයට හා සංස්කෘතියට ඇති කළ ඍජු හා වක්‍ර බලපෑම කෙටියෙන් විස්තර කරන්න.

- සේද මාවත (ගෘහ නිර්මාණ ශිල්පය, කලාව, සංගීතය, අත්කම්, පිඟන් මැටි)

- ආගම (බුදු දහම, කොන්ෆියුෂියස් දහම)

- චීන රූපාක්ෂර මාලාව

- ගැටුම් සහ අරගල

• කොරියාව සහ එහි භූගෝලීය පිහිටීම, යාබදව පිහිටා ඇති චීනය සහ ජපානය කොරියානු ජන සමාජයට හා සංස්කෘතියට ඇති කළ ඍජු හා වක්‍ර බලපෑම් පිළිබඳ කරුණු එක්රැස් කිරීමට යොමු කරවා අදාළ තොරතුරු පංතිය ඉදිරියේ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

• කොරියාවේ සිතියම ඇඳ එහි කොරියාවේ ප්‍රධාන දූපත්, අග නගරය ආදිය ලකුණු කර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

• කොරියාව සහ ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම ආශ්‍රිත දැනුම භාවිත කරමින් දෙරට පිළිබඳව සංසන්දනාත්මක ව සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ලෝක සිතියමක්
- කොරියානු අර්ධද්වීපයේ සිතියමක්
- වීඩියෝ දර්ශන
- කොරියාවේ භූවිෂමතා ලක්ෂණ දැක්වෙන පින්තූර පැවරුම් පත්

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- පහත නිර්ණායක පිළිබඳව ද සැලකිලිමත් වෙමින් ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීම සිදු කරන්න.
  - කණ්ඩායමේ සියලු දෙනා ම කොටස් වශයෙන් ඉදිරිපත් කිරීම
  - නිර්මාණශීලි බව
  - තාක්ෂණය භාවිත කිරීම
  - සාමූහික බව

• උගත් දැනුම භාවිත කරමින් කණ්ඩායම් හෝ ඒකල වශයෙන් සහභාගි විය හැකි ප්‍රශ්න විචාරාත්මක වටයක් පැවැත්වීම.

• උගත් කරුණු ආශ්‍රයෙන් කොරියාව, ජපානය හා චීනයේ සංස්කෘතික අංගවල සමාන අසමානතා පිළිබඳ තම අදහස් ඉදිරිපත් කිරීම

**විමර්ශන**

- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org
- 한국의 지리/ 한국 지도:

http://dh.aks.ac.kr/Korea100/wiki/index.php/%ED%95%9C%EA%B5%AD%EC%9D%98_%EC%A7%80%EB%A6%AC

- 한국의 강:

https://www.water.or.kr/life/history/history03_03.do?seq=822&p_group_seq=817&menu_mode=3

**නිපුණතාව** 1.0 කොරියානු ජන සමාජය, සංස්කෘතිය හා ජීවන රටාව පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 1.2 කොරියානු ජාතිකයින්ගේ ආචාර ක්‍රම හා එක් එක් අවස්ථාවන්ට ගැළපෙන ආචාර පද භාවිත කරයි.

**කාලච්ඡේද** 6

**ඉගෙනුම් පල**

- උගත් ආචාර පද අවස්ථාවන්ට අනුකූල ව නිවැරදි ව භාවිතයේ යොදයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- කොරියානු සංස්කෘතියෙහි ආචාර කිරීමේ වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.
- කොරියන් ජාතිකයන් හමුවී ආචාර කරන අවස්ථා දැක්වෙන වීඩියෝවක් හෝ ඡායාරූප කිහිපයක් පෙන්වා ඒ ඒ අවස්ථාවන්ට අනුව ආචාර කිරීමේ ඉරියව් වෙනස් වන බව තනි ව නිරීක්ෂණය කර අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

උදා: 손을 흔들어 인사하기, 악수하기, 고개를 숙여 인사하기

- නැවත විඩීයෝ දර්ශන හෝ ඡායාරූප එකින් එක පෙන්වමින් කවුරුන් කුමන අවස්ථාවක කුමන ආකාරයට ආචාර කරන්නේ ද යන්න පැහැදිලි කරන්න.

උදා: 친구일 때 - 친구 이름을 부르며 손을 흔들어 반말로‶안녕″이라고 인사한다.

어른일 때 - 고개를 숙이고 높임말로‶안녕하세요″라고 인사한다.

- ආචාර කිරීමේ දී කොරියන් ජාතිකයන් භාවිත කරන නිවැරදි ඉරියව් පන්තිය ඉදිරියේ නිරූපණය කර පෙන්වන්න.
- ආචාර කිරීමේ දී භාවිත කරන යෙදුම් /උච්චාරණය කළුලෑල්ලේ සටහන් කර එය නිවැරදි ව උච්චාරණට කිරීමට ශිෂ්‍යයන් පුහුණු කරවන්න.
- ශිෂ්‍යයන් කිහිප දෙනෙකු පන්තිය ඉදිරියට කැඳවා ගුරුවරයා අනුකරණය කරමින් නිවැරදි ඉරියව් භාවිත කර ආචාර කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මූලික ආචාර පද/යෙදුම් සහ ඊට නිවැරදි ව ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

안녕하세요 / 안녕

안녕히 가세요 / 안녕히 계세요

만나서 반가워요

주말 잘 보내세요

고마워요 / 아니에요

미안해요/죄송해요

괜찮아요

내일 만나요

생일 축하해요

- ඉහතින් දක්වා ඇති ආචාර විධි සහිත හඬපටයකට හෝ ගුරුවරයාගේ උච්චාරණයට සවන් දී පුහුණුවීමට ඉඩ සලසා දෙන්න.

- මීට අමතරව පහතින් දක්වා ඇති යෙදුම් ද ආචාර කිරීමේ දී භාවිත කරන බව වටහා දෙන්න.

- මතුපිටින් ප්‍රකාශිත අදහසට වඩා වෙනස් අර්ථයක් ගැබ් ව ඇති ප්‍රකාශන අවස්ථානුකූල ව පැහැදිලි කර මෙයට ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.

(1) 가: 어떻게 오셨어요?

나: 돈 찾으러 왔어요/선생님을 만나러 왔어요.

(2) 언제 밥 한번 먹어요/ 차 한잔해요. මෙය හුදෙක් ආචාර යෙදුමක් පමණකි.

(3) 어디 가요? මෙහි හඬ උස් පහත් වීම අනුව අර්ථය වෙනස් වේ.

(4) 식사하셨어요?

(5) 별일 없으시죠?

• උගත් ආචාර විධි සහ යෙදුම් භාවිත කර විවිධ අවස්ථා නිරූපණ කරමින් පහතින් දක්වා ඇති ආකාරයට ශිෂ්‍යයන් දෙදෙනෙකු බැගින් කණ්ඩායම් කර පුහුණු කරවන්න.

උදා: තමාව හඳුන්වා දෙන අවස්ථාවක්

가: 안녕하세요. 처음 뵙겠습니다. 저는* 입니다.

나: 안녕하세요. 저는* 입니다. 만나서 반갑습니다.

වෙන්වීමේ දී

가: 안녕히 가세요.

나: 안녕히 계세요.

• ඒ ඒ අවස්ථාවන්වල දී කොරියන් ජාතිකයන් සහ ශ්‍රී ලාංකිකයන් ආචාර කිරීමේ ආකාරය හා සමාන අසමානතා පිළිබඳ සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- ආචාර විධි සහ යෙදුම් දක්වන පින්තූර
- හඬ පට
- ආචාර කිරීමේ විවිධ අවස්ථාවන්ට අදාළ මාතෘකා ලියූ කාඩ්පත්

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- ශ්‍රී ලංකාවේ සහ කොරියාවේ ආචාර කිරීමේ විධි සහ යෙදුම් තුළ ඇති සමාන අසමානතා හඳුනා ගෙන සංස්කෘතිමය වෙනස්කම් පැහැදිලි කිරීම.
- විවිධ අවස්ථාවන්ට අදාල මාතෘකා ශිෂ්‍යයන්ට ලබා දීම මඟින් අවස්ථානුකූල ව නිවැරදි ව ආචාර කිරීම.

**විමර්ශන**

- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org

**නිපුණතාව** 1.0 කොරියානු ජන සමාජය, සංස්කෘතිය හා ජීවන රටාව පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 1.3 කොරියානු ජන සමාජයට අයත් විවිධ සංස්කෘතික අංග සහ ඒ හා බැඳුණු සමාජ හා ඓතිහාසික පසුබිම පිළිබඳ දැනුම සහිතව භාෂාව භාවිත කරයි.

1.4 කොරියානු සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගෙන කොරියානු සංස්කෘතිමය වටිනාකම් අවශ්‍ය අවස්ථාවල දී ජීවිතයට එක් කර ගනියි.

**කාලච්ඡේද** 19

**ඉගෙනුම් පල**

- කොරියානු ජන සමාජයට අදාළ විවිධ සංස්කෘතික අංග හා එහි සුවිශේෂතා පිළිබඳව පැහැදිලි ව විස්තර කරයි.
- කොරියානු සමාජ සංස්කෘතික හා ජන ජීවිතයට අදාළ කරුණු ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා සංසන්දනය කරමින් ඉදිරිපත් කිරීම් කරයි.
- කොරියානු සමාජ සංස්කෘතික හා ජන ජීවිතයට අදාළ විවිධ සංස්කෘතික අංග පිළිබඳ තම අදහස් ඉදිරිපත් කරයි.
- කොරියානු සංස්කෘතියට අදාළ තොරතුරු එක් රැස් කර කොරියානු සංස්කෘතිකාංග ප්‍රතිනිර්මාණය කර ප්‍රදර්ශනය කරයි.
- අනෙකුත් සංස්කෘතීන්ට ගරු කරයි.
- කොරියානු සංස්කෘතිකාංග පිළිබඳ අත්දැකීම් ලබා ඇති ශිෂ්‍යයන් සමඟ ඒ පිළිබඳ අදහස් බෙදා ගනියි.

## 1. 한국의 상징

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- අදාළ පාඩමට පෙර සූදානමක් ලෙස කොරියාවේ සංකේත හා සම්බන්ධ රූප/විස්තර සොයා ගෙන එන ලෙසට ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර තමන් සොයාගත් කරුණු සාකච්ඡා කර ගොනු කර ගැනීමට අවස්ථාව ලබාදෙන්න.

- 한강, 한글, 한복, 한옥, 무궁화, 태극기 යනාදිය පැහැදිලිව පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.
- '한강, 한글, 한복, 한옥' වචන හතරේ දැකිය හැකි සමාන ලක්ෂණය කුමක්දැයි විමසන්න.
- ' 한 'යන වචනයේ සාමාන්‍ය අර්ථය පැහැදිලි කර ඉහත කි වචනවල 한 භාවිත වන අර්ථය පැහැදිලි කරන්න.
- 한 යන්නෙහි සාමාන්‍ය අර්ථය 'විශාල, පුළුල්, උස්, බොහෝ එසේත් නැතහොත් මධ්‍යස්ථ, වැදගත් මූලික යන්නයි.
- එසේම කොරියාව නැතහොත් කොරියානු ජනතාව හැඳින්වීමට පොදුවේ ' 한 'යන වචනය භාවිත කරයි. ඉහත වචනවල ' 한 ' භාවිත වන්නේ මෙම අදහසිනි.
- ඒ අනුව 한글 කොරියානු ජාතිකයින්ගේ අක්ෂර බවත් 한복 කොරියානුවන්ගේ ඇඳුම වන බවත් 한옥 කොරියානුවන්ගේ නිවාස හඳුන්වන නම බවත් පැහැදිලි කර දෙන්න.
- පෙළපොතේ සඳහන් ඉහත වචන හතරට අමතරව 한 යෙදෙන වචන කිහිපයක් සඳහා උදාහරණ දක්වන්න.
- උදා: 한국 - 한 ජාතිකයන්ගේ රට යන අර්ථයෙන් වර්තමානයේ කොරියාව හඳුන්වන නම යෙදෙන බව පැහැදිලි කරන්න.
- 한말- 한 ජාතිකයන්ගේ බස = කොරියානු බස 한국어= 한말
- 한식- 한 ජාතිකින්ගේ ආහාර = කොරියානු කෑම
- 한류 - කොරියානු රැල්ල ( කොරියානු පොප් සංගීතය, ටෙලි නාට්‍ය,ආහාර හා විලාසිත යනාදී සංස්කෘතික අංග ආසියාව මුල්කර ගෙන ප්‍රචලිත වීම )
- 한지 - සම්ප්‍රදායික කොරියානු කඩදාසි
- 한강, 한글, 한복, 한옥, 무궁화, 태극기 යනාදිය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

| | |
|---|---|
| 한강 | • සෞල් නුවර හරහා ගලා යන ගංගාවයි.<br>• මෙය 남한강 සහ 북한강 ලෙස බෙදී යන අතර කන්ග්වොන් පළාත චුන්චෝන් පළාත හා සෞල් නගරය හරහා ගොස් කහ මුහුදට වැටේ.<br>• පළාත් කිහිපයක ජනතාවට පානිය ජලය සපයනු ලබන්නේ මේ හන් ගංගාවෙන් ය.<br>• 한강 අශ්‍රිත ව 새빛섬, 여의도, 선유도, 밤섬, 노들섬 යන දූපත් දැකිය හැක<br>• 한강 හරහා දිවෙන පාලම් 37 දක්නට හැකිය. ඒ අතරම දුම්රිය මාර්ග කිහිපයක් ම මේ හරහා ගමන් කරයි.<br>• ඉතා ඈත අතීතයේ සිට හන් ගඟ සංස්කෘතිකමය සමාජීය හා ආර්ථික වශයෙන් වැදගත්කමක් හොබවයි.<br>• 1953 න් පසු කොරියාව ලබාගත් ඉතා විශාල ආර්ථික දියුණුව හඳුන්වන 한강의 기적 (miracle on the han river ) හන් ගඟ ආශ්‍රිත ව නිර්මාණය වුවකි.<br>• සෞල් නගරයේ පරිපාලන ඒකක කිහිපයක් හන් ගඟ ආශ්‍රිත ව බෙදා වෙන් කොට ඇත. ඒ අනුව හන් ගඟේ දකුණු පෙදෙස ' 강남 'ලෙසත්, උතුරු පෙදෙස ' 강북 'ලෙසත් බටහිර පෙදෙස ' 강서, 'නැගෙනහිර පෙදෙස 강동 ලෙසත් දැක්විය හැක.<br>• ඔබ අසා ඇති 강남 style ගීතය මින් 강남 පෙදෙස ඒකක කරගෙන එහි සමාජීය වටපිටාව හා සම්බන්ධව ලියවූවකි. |
| 한글 | • කොරියානු හෝඩිය මේ නමින් හැඳින් වේ.<br>• සේජෝන්ග් රජුගේ මැදිහත්වීමෙන් 1443 දී ' 훈민정음 ' යන නමින් නිර්මාණය කොට ප්‍රකාශයට පත් කරන ලදී.<br>• රට වැසියන්ට ඉගැන්වීම සඳහා භාවිත වන 'නිවැරදි ශබ්ද' යන්න ' 훈민정음 ' යන්නෙන් අදහස් කෙරේ.<br>• කොරියානු අක්ෂර ශබ්ද උත්පත්ති කර ගත් අක්ෂර වේ.<br>• 한복 යනු කොරියාවේ ජාතික ඇඳුම යි.<br>• මෙයට දිගු ඉතිහාසයක් තිබුන ද කාලයෙන් කාලයට විවිධ කොටස් එක් වීම මෙන්ම ඉවත් වී ගොස් ද ඇත.<br>• කාන්තා පිරිමි ළමා' 한복 ' ද දක්නට ලැබේ. |

| | |
|---|---|
| | • ' 저고리, 치마, 바지 ' වශයෙන් ' 한복 ' කොටස් කර දැක්විය හැක.<br>• වර්තමානයේ දී ' 한복 ' විවාහ උත්සව වැනි විශේෂ අවස්ථාවලදී පමණක් අඳිනු දක්නට ලැබෙයි.<br>• එදිනෙදා ජීවිතයට පහසු වන ආකාරයට සකසාගත් නවීන පන්නයේ ' 개량 한복 ' වර්තමානයේ බහුල ව අඳිනු ලැබේ. |
| 한복 | • |
| 한옥 | • ' 한옥 ' යනු කොරියාවේ සම්ප්‍රදායක නිවාස යි.<br>• අතීතයේදී නිවාස නිර්මාණය කර ඇත්තේ ස්භාවික දේවල් වන ගල්, පස්, මැටි වැනි දේවල් යොදා ගැනීමෙන් ය. අතීතයේ සීතලෙන් ආරක්ෂා වීම සඳහා ' 온돌 ' යන ක්‍රමවේදයක් භාවිත කරන ලදී.<br>• ' 한옥 'නිවසක දක්නට ලැබෙන අංග අතර ' 안방, ' ප්‍රධාන වේ. එමෙන්ම ඉහළ හා පහළ පැලැන්තිය අනුව නිවාසවල දක්නට ලැබෙන අංග ද වෙනස් වන බවක් දක්නට ලැබේ. |
| 무궁화 | • ' 무궁화 ' යනු කොරියාවේ ජාතික පුෂ්පයයි.<br>• මෙය කොරියාවේ රාජ්‍ය ලාංජනය ලෙස භාවිත කරයි.<br>• ' 무궁화 ' විවිධ වර්ණයෙන් යුක්ත වෙන අතර සුදු, රතු, රෝස යන වර්ණයන් ප්‍රධාන වේ. කොරියාවේ ජාතික ගීතයේ ද ' 무궁화 ' පුෂ්පය පිළිබඳ දක්වා ඇත. |
| 태극기 | • මෙය කොරියාවේ ජාතික කොඩිය වේ.<br>• ජාතික කොඩිය නිර්මාණය කිරීමේදී විවිධ දර්ශනවල මූලධර්ම භාවිතයට ගෙන ඇති බවක් දක්නට ලැබේ.<br>• - සුදු පැහැති පසුබිමේ රතු හා නිල් පැහැති වර්ණ දෙකක් දක්නට ලැබෙන අතර සතර දිශාවෙහි එකිනෙකට වෙනස් කළු පැහැති ඉරි කැබලි දක්නට ලැබෙන අතර මෙකී එකිනෙකට වෙනස් අර්ථ දක්නට ලැබේ. සුදු පැහැති පසුබිමෙන් කොරියානුවන් සාමයට හා පිරිසිදු කමට දක්වනු ලබන කැමැත්තයි. මධ්‍යයෙහි රතු හා නිල් වර්ණවලින් දැක්වෙන ගෝලයක් දක්නට ලැබේ. මෙම වර්ණ දෙකන් නිදහස හා සමබරතාව නිරූපණය කරයි. මෙලෙස කොටස් දෙකට වෙන්ව ඇති බැවින් යෙන් හා ඉන්ගේ ධර්මතාව නිරූපණය කරයි. සතර දිශාන්වන්හි දක්නට ලැබෙන කළු ඉරි මගින් ජලය, අහස, පොළව හා ගින්දර නිරූපණය කරයි. |

• ශිෂ්‍යයන් කණ්ඩායම් කර ශ්‍රී ලංකාව නියෝජනය කරන සංකේත පිළිබඳව සංසන්දනාත්මක ව සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

• ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලි අදහස් ඇසුරින් කොරියාව නියෝජනය කරන සංකේත දැක්වෙන ලෙස නිර්මාණ කරවා පන්තිකාමරයේ ප්‍රදර්ශනය කරන්න.

- කොරියාව නියෝජනය කරන සංකේත ශිෂ්‍යයන්ට කණ්ඩායම් වශයෙන් බෙදා දී නිර්මාණ කිරීමට සැලැස්වීම (උදා: හන්බෝක් ආකෘතියක් නිර්මාණය, කඩදාසි හෝ රෙදි ආශ්‍රයෙන්, ' 태극기 'නිවැරදිව ඇඳීම, ' 한글 ' ආශ්‍රයෙන් විවිධ නිර්මාණ කිරීම)

• හන්ගල් හෝඩිය ලියා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම

• කොරියාව නියෝජනය කරන සංකේත පිළිබඳ වැඩිදුර තොරතුරු රැස් කර බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- පිංතූර
- ඡායාරූප
- සජීව නිදර්ශක

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- කොරියාව නියෝජනය කරන සංකේත පිළිබඳ වැඩිදුර තොරතුරු රැස් කර බිත්ති පුවත්පතකට ලිපි සකස් කිරීම හෝ පොත් පිංචක් නිර්මාණය කිරීම
- ශ්‍රී ලංකාව සහ කොරියාව නියෝජනය කරන සංකේත සංසන්දනය කර එහි වෙනස්කම් වලින් පිළිබිඹු වන සංස්කෘතික ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කිරීම.

## 2. 한국의 명절

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

'설날' සහ '추석'යන උත්සව පිළිබඳ විස්තර කරමින් ඒ ඒ උත්සව යෙදෙන දිනය (චන්ද්‍ර මාස ක්‍රමය), සමරන ආකාරය, සිරිත් විරිත්, විශේෂිත ආහාර සහ ක්‍රියාකාරකම් ආදිය කෙටියෙන් පැහැදිලි කරන්න

### (1) 설날(음력 1 월 1 일)

의미: 음력 새해가 시작되는 날

특별 음식: 떡국

하는 일: 세배(어른에게 절함)와 세뱃돈 받기, 윷놀이

설 연휴 : 주로 3 일 쉽니다(설날 전날, 설날, 설날 다음날은 공휴일이 됨)

### (2) 추석(음력 8 월 15 일)

의미: 한해 농사에 감사하는 날

특별 음식: 송편

하는 일: 차례를 지내고 성묘하기, 달맞이, 강강술래 놀이

추석 연휴 : 주로 3 일 쉽니다. (추석 전날, 추석, 추석 다음날은 공휴일이 됨)

- කොරියාවේ ප්‍රධාන උත්සව පිළිබඳව අන්තර්ජාලය ඇසුරින් තොරතුරු රැස්කිරීමට ශිෂ්‍යයන් යොමුකරන්න.
- කොරියාවේ සහ ශ්‍රී ලංකාවේ උත්සව පිළිබඳ සංසන්දනාත්මක ව සාකච්ඡා කරන්න

**ගුණාත්මක යෙදවුම්**

- පින්තූර
- ඡායාරූප
- වීඩියෝ දර්ශන
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- පින්තූර, ඡායාරූප නිවැරදි ව හඳුනා ගනිමින් ඒ ඒ උත්සව සැමරීමේ අරමුණු, විශේෂිත ආහාර සහ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ විස්තර කිරීම.
- ඒ ඒ උත්සව අවස්ථා වලින් පිළිබිඹු වන කොරියානුවන්ගේ සහ ශ්‍රී ලාංකිකින්ගේ ජීවන රටාවන් පිළිබඳ තම අදහස් ඉදිරිපත් කිරීම.

## 3. 한국의 가족 호칭

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- පවුලේ ඡායාරූපයක් හෝ චිත්‍රයක් රැගෙන එන ලෙස දැනුවත් කරන්න.
- පවුලේ සමාජිකයන් පිළිබඳව දන්නා/උගත් වචන මොනවාදැයි ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- පවුලේ සමාජිකයන් පැහැදිලිව හඳුනා ගත හැකි චිත්‍රයක්/රූපයක් භාවිත කර අදාළ වචන සහ එහි උච්චාරණය පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.
- භාවිතයේ දී වෙනස්කම් සහිත වචන පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන්න.

උදා: 언니/누나

오빠/형

(외)할아버지/(외)할머니/(외)삼촌

- තම පවුලේ සාමාජිකයන් පිළිබඳ යහළුවන් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පවුලේ සාමාජිකයන් ආමන්ත්‍රණය කිරීමේ දී දෙරටේ පවතින සමඅසමතා පිළිබඳ සාකච්ඡා කරන්න.
- ගෙන ආ ඡායාරූපය පෙන්වමින් තම පවුලේ සාමාජිකයන් පන්තිය ඉදිරියේ හඳුන්වා දීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පින්තූර
- ඡායාරූප
- වීඩියෝ දර්ශන
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**


- පවුලේ සාමාජිකයන් හා සම්බන්ධ වචන, අර්ථය හා භාවිත වන අවස්ථා නිවැරදිව ප්‍රකාශ කිරීම.
- තම පවුලේ සාමාජිකයන් පිළිබඳව කෙටියෙන් ලිඛිත ව හෝ වාචිකව හඳුන්වා දීම (නම, රැකියාව ආදී තොරතුරු)

## 4. 한국인의 인사법

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**


• පුද්ගල සම්බන්ධතාව හෝ ඒ ඒ අවස්ථාව මත පදනම් ව හිස නමා ආචාර කිරීම වෙනස් ව සිදු කළ යුතු බව පැහැදිලි කරන්න.

- අර්ධ ආචාරය (목례/반경례)




목례는 다양한 일상생활 중에 간단히 주고받는 인사입니다.
계단이나 엘리베이터와 같은 좁은 장소나, 화장실, 식당과 같은 장소에 있을 때, 전화통화 중, 한 번 인사한 사람과 또 마주쳤을 경우에 하는 인사입니다.
상체는 15 도 정도 숙이는 것이 좋습니다.

- සාමාන්‍ය ආචාරය (보통 인사/보통례)




보통 인사는 가장 기본이 되는 인사입니다.
웃어른께 인사할 때나 출퇴근할 때, 감사의 표현을 할 때, 고객 맞이할 때나 배웅할 때 하는 인사가 모두 해당합니다. 정중하지만 과하지 않아 부담을 느끼지 않는 인사입니다.
상체는 30 도 정도 숙이는 것이 좋습니다.

- ආචාරශීලී ආචාරය (전중한 인사/정중례)




정중한 인사는 말 그대로 정중함을 가득 담아 상대방에게 표현하는 인사입니다.
예의를 갖춰 감사를 표현할 때, 진심으로 사과할 때, VIP 손님이나 단체손님을 배웅할 때, 어렵고 중요한 자리의 첫 만남 때 하는 인사입니다.
상체는 45 도 정도 숙이는 것이 좋습니다.




공식적인 상황에서는 나보다 나이가 많은 사람, 처음 만나는 사람과는 악수를 하기도 합니다.




나보다 나이가 적은 사람, 잘 아는 사이, 친구 사이에서는 가볍게 손을 흔들며 반말로 인사합니다

- ඒ ඒ අවස්ථාවල දී කොරියන් ජාතිකයින් සහ ශ්‍රී ලාංකිකයන් ආචාර කිරීමේ ආකාරය හා සමාන අසමානතා පිළිබඳ සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- සජීව නිදර්ශක

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- අවස්ථානුකූල ව නිවැරදි ආචාර පද භාවිත කොට ආචාර කිරීම

## 5. 한국의 상차림

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- ආහාර පිළිගැන්වීම සඳහා සකස් කරන ලද කොරියාවේ කෑම මේසයක ඡායාරූපයක් ශිෂ්‍යයන්ට පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.

- ඡායාරූපයෙන් පෙනෙන දේ පිළිබඳව ශිෂ්‍යයන්ගේ නිරීක්ෂණ මෙන්ම ශ්‍රී ලංකාවේ කෑම මේසය හා සංසන්දනය කිරීමේ දී දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ ශිෂ්‍යයන්ගේ අදහස් විමසන්න.

- කොරියානු කෑම මේසයක් සකස් කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.

- 밥과 국, 반찬 등 다양한 음식을 두고 먹는다.

- 밥은 왼쪽에 국은 오른쪽에 놓는다.

- 숟가락과 젓가락은 국의 오른쪽에 놓는다.

- 나물, 간장, 구이, 찌개, 김치 등의 반찬을 놓고 먹는다.

- කොරියන් ජාතිකයන් ආහාර ගැනීමේ දී භාවිත කරන කූරු (젓가락) භාවිත කරන ආකාරය පැහැදිලි කර ශිෂ්‍යයන් ක්‍රියාකාරකම්වල යොදවන්න.

- උගත් කරුණු මත පදනම් ව ශ්‍රී ලංකාවේ සහ කොරියාවේ කෑම මේසය සකස් කිරීම, ආහාර පිළිගැන්වීමේ සිරිත් විරිත්, කොරියානුවන්ගේ සහ ශ්‍රී ලාංකිකයන්ගේ ආහාර රටාවන් පිළිබඳ සංසන්දනාත්මක ව සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පින්තූර
- ඡායාරූප
- වීඩියෝ දර්ශන
- PPT
- ආහාර ගැනීමේ දි භාවිත කරන කූරු (젓가락)

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- ආහාර ගැනීමේ දී භාවිතා වන යෙදුම් නිවැරදි ව භාවිතා කර කොරියානු කෑම මේසයක දී අනුගමනය කළ යුතු ආචාර ධර්ම අනුගමනය කරමින් රඟ දැක්වීම.
- ශ්‍රී ලාංකික සහ කොරියානු කෑම මේසයක සමඅසමතා හඳුනා ගෙන ඒ මගින් කොරියානුවන්ගේ සහ ශ්‍රී ලාංකිකයන්ගේ ආහාර රටාවන් පිළිබඳ තම අදහස් ඉදිරිපත් කිරීම.

## 6. 한국의 축제

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- කොරියාවේ විවිධ උත්සව, ප්‍රදේශ, ඍතු ආශ්‍රිතව විවිධ සැණකෙළි පවත්වනු ලබන බව පැහැදිලි කරමින්, ඒ අතුරින් ප්‍රසිද්ධ සැණකෙළි ලෙස හැඳින්විය හැකි ' 진해군항제, 보령머드축제, 서울세계불꽃축제, 화천산천어축제 ' පිළිබඳ දැනුවත් කරන්න.

| 행사 이름 | 행사 장소 | 행사 기간 | 기타 내용 |
|---|---|---|---|
| 진해군항제<br>(Jinhae Gunhangje Festival) | 경상남도<br>창원시 진해 | 매년<br>4 월 1 일~4 월 10 일 | 한국의 대표적인 봄 축제이다.<br>아름다운 벚꽃을 볼 수 있다. |
| 보령머드축제<br>(Boryeong Mud Festival) | 충청남도<br>보령시<br>대천해수욕장 | 매년 7 월 | 머드 마사지 체험힐 수 있다.<br>불꽃 축제도 있다. |
| 서울세계불꽃축제<br>(Seoul International Fireworks Festival) | 서울 여의도 | 매년 10 월 첫 번째 토요일 | 서울의 대표적인 축제 중 하나이다.<br>여러 나라 불꽃을 볼 수 있다. |

| | | | |
|---|---|---|---|
| 화천산천어축제 (Hwacheon Sancheoneo Ice Festival) | 강원도 화천군 | 매년 1 월 | 한국의 대표적인 겨울 축제이다. 산천어를 직접 잡아 맛 볼 수 있다. |

- ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සැණකෙළි පිළිබඳ සාකච්ඡා කරන්න.
- මීට අමතරව කොරියාවේ පවත්වන සැණකෙළි පිළිබඳ තොරතුරු රැස් කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පින්තූර
- ඡායාරූප
- වීඩියෝ දර්ශන
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- කොරියාවේ ප්‍රසිද්ධ සැණකෙළි ලෙස හැඳින්විය හැකි ' 진해군항제, 보령머드축제, 서울세계불꽃축제, 화천산천어축제 'පිළිබඳ විස්තර කිරීම.

- පෙළ පොතෙහි දැක්වෙන සැණකෙළිවලට අමතරව කොරියාවේ පවත්වන සැණකෙළි පිළිබඳ තොරතුරු රැස් කිරීම.

## 7. 한국의 전통 시장

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

• කොරියාවේ අගනුවර ලෙස සැලකෙන සොවුල් නගරය මෙන් ම අනෙකුත් නගර ආශ්‍රිතව ද සාම්ප්‍රදායික වෙළඳ පොළ දක්නට ඇති බව පැහැදිලි කරන්න.

• ඡායාරූප හෝ වීඩියෝ දර්ශන යොදා ගනිමින් ප්‍රධාන සාම්ප්‍රදායික වෙළඳ පොළ ගැන හඳුන්වා දෙන්න.

• පිහිටා ඇති නගරය, ප්‍රසිද්ධ වී ඇත්තේ කුමන හේතුන් නිසා ද, ප්‍රධාන වශයෙන් මිල දී ගත හැකි භාණ්ඩ යනාදිය

| 이름 | 위치 | 살 수 있는 물건 |
|---|---|---|
| 남대문시장 | 서울 | 다양한 문건과 먹을거리가 많다. |
| 동해중앙시장 | 강릉 | 신선한 수산물과 생활에 필요한 물건이 많다. |
| 동문시장 | 제주도 | 채소, 과일, 수산물, 곡물 등이 많다. |
| 자갈치시장 | 부산 | 신선한 수산물이 많다. |

• කොරියාවේ සහ ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සාම්ප්‍රදායික වෙළඳ පොළ සංසන්දනය කරමින් සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පින්තූර
- ඡායාරූප
- වීඩියෝ දර්ශන
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

• කොරියාවේ සාම්ප්‍රදායික වෙළඳ පොළ පිළිබඳ වැඩිදුර තොරතුරු රැස් කිරීම.

• කොරියාවේ සහ ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සාම්ප්‍රදායික වෙළඳ පොළ සංසන්දනය කරමින් තම අදහස් ඉදිරිපත් කිරීම.

## 8. 한국의 대표 음식

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- කොරියාව නියෝජනය කරන ආහාර දැක්වෙන ඡායාරූප, වීඩියෝ දර්ශන භාවිත කරමින් ඒ ඒ ආහාර පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

- **김치** : 한국인의 밥상에서 빼놓을 수 없는 반찬이다.

  김치는 종류가 다양하다.

  지방에 따라서 만드는 방법과 사용하는 재료도 조금씩 다르다.

  김치는 발효 음식이다.

  전세계에서 인정받은 건강 음식이다.

- **비빔밥** : 밥, 다양한 채소, 고추장과 참기름으로 만든다.

  밥에 재료를 넣고 비벼서 먹는다.

  쉽게 만들 수 있다.

  외국인들도 좋아하는 한국의 대표 음식이다.

- **삼계탕** : 한국의 대표 보양식이다.

  닭, 찹쌀, 인삼, 대추, 밤 등을 넣고 만드는 요리다.

  몸에 좋은 재료를 많이 사용해서 여름에 먹으면 좋다.

  외국인들도 좋아한다.

- **삼겹살** : 돼지고기를 구워서 만드는 음식이다.

  채소와 쌈장, 마늘과 함께 먹는다.

  외식이나 회식할 때 자주 먹는다.

- **김밥** :한국의 대표 분식이다.

  밥, 채소, 계란, 치즈, 참치 등 자신이 좋아하는 재료를 사용할 수 있다.

  김에 싸서 만든다.

  소풍을 갈 때, 간단하게 식사를 해결할 때 자주 먹는다.

- **떡볶이** : 한국의 대표 분식이다.

  쌀 떡이나 밀떡, 고추장으로 만든다.

  매콤한 맛이 있다.

  맵지 않게 간장으로 만드는 궁중떡볶이도 있다.

• කොරියාවේ ප්‍රසිද්ධ ආහාර පිළිබඳ තොරතුරු රැස් කිරීමට උපදෙස් ලබා දෙන්න.

• ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ආහාර හා කොරියානු ආහාර සසඳමින් ඒ පිළිබඳ කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කිරීමටත්, පන්තිය ඉදිරියේ ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.

• කොරියන් ආහාර පිළිබඳ අත්දැකීම් ඇති ශිෂ්‍යයන් වේ නම් අනෙක් ශිෂ්‍යයන් හා තම අත්දැකීම් බෙදා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පින්තූර
- ඡායාරූප
- වීඩියෝ දර්ශන
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- වෙනත් කොරියානු ආහාර පිළිබඳ තොරතුරු රැස් කිරීම.
- කොරියානු ආහාර සහ ශ්‍රී ලාංකික ආහාර ඇති වෙනස්කම් හා විශේෂතා නම් කිරීම

**විමර්ශන**

- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org
- Encyclopedia of Korean Culture - http://encykorea.aks.ac.kr/

**නිපුණතාව** 2.0 ශබ්ද උච්චාරණය, උච්චාරණ රීති සහ කොරියානු අක්ෂර හඳුනා ගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 2.1 කොරියන් අක්ෂර මාලාව සම්බන්ධ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද** 02

**ඉගෙනුම් පල**

- කොරියන් අක්ෂර මාලාව බිහිවීමට බලපෑ ඓතිහාසික පසුබිම විස්තර කරයි.
- කොරියන් අක්ෂර නිර්මාණය කිරිමෙහි ලා පුරෝගාමී වූ 'සෙජොන්' රජු ගැන විස්තර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- කෘෂි කාර්මික සමාජ ආර්ථික පසුබිමක් පැවැති අතීත කොරියානු සමාජයේ ඉහළ සමාජ පැළැන්තියට පමණක් සීමා වී තිබූ කියවීමේ හා ලිවීමේ හැකියාව සාමාන්‍ය ජනයා අතර ප්‍රචලිත කිරීමේ අරමුණ මුල් කර ගෙන 'ජොසොන්' යුගයේ 4 වන රජු වන 'සෙජොන්' රජතුමා කොරියන් අක්ෂර මාලාව නිර්මාණය කළ බව පැහැදිලි කරන්න.
- 'සෙජොන්' රජතුමාගේ කාලයේ කොරියන් අක්ෂර මාලාව බිහි වීම පමණක් නොව විද්‍යාව හා තාක්ෂණික ක්ෂේත්‍රයන්ගේ ප්‍රගමනයට ද කටයුතු කළ බව පැහැදිලි කරන්න. (උදාඃ ජල ඔරලෝසුව, හිරු තැටිය, තරු නිරීක්ෂණය කරන උපකරණ, වර්ෂාමානය හා සෝවුල් නුවර කේන්ද්‍ර කර ගත් දින දර්ශනයක් වැනි නිර්මාණ)
- මෙවැනි කරුණු මත 'සෙජොන්' රජු කොරියානු ඉතිහාසයේ වැදගත් චරිතයක් වූ අතර ඒ අතරිනුත් වඩාත් වැදගත් වූයේ කොරියන් අක්ෂර මාලාව නිර්මාණය කිරීම බව පැහැදිලි කරන්න.
- කොරියන් අක්ෂර මාලාව බිහි වීමට පෙර ඉතා සංකීර්ණ වූ චීන රූපාක්ෂර කොරියාව තුළ භාවිත කරනු ලැබූ අතර ඒවා වියතුන්ට පමණක් සීමා වූ අතර සාමාන්‍ය ජනතාවට එය භාවිත කිරීමට අපහසු වූ බව විස්තර කරන්න.
- කොරියන් අක්ෂර මාලාවක් නිර්මාණය කිරීමට රජු ගන්නා ලද තීරණයට එකල සිටි ඇතැම් විද්වතුන් විරුද්ධත්වය පළ කළ ද 'සෙජොන්' රජුගේ ප්‍රධානත්වයෙන් යුක්ත විද්වත් කණ්ඩායමක් විසින් 1443 දී කොරියන් අක්ෂර මාලාව නිර්මාණය කළ බව පැහැදිලි කරන්න.
- මෙම අක්ෂර මාලාව මුලින් ම 'හුන්මින්ජොංඅුම්' (훈민정음) (මෙහි අරුත වන්නේ සාමාන්‍ය ජනයාට උගත් වන නිවැරදි ශබ්ද යන්නයි) ලෙස හැඳින් වූ අතර පසුකාලීනව මෙය 'හන්ගල්' (한글) ලෙස හැඳින්විමට පටන් ගත් බව විස්තර කරන්න.
- කොරියානු අක්ෂර මාලාවේ ඇති වැදගත්කම පදනම් කර ගෙන 1997 'යුනෙස්කෝ ලෝක උරුමයක්' ලෙස 'හුන්මින්ජොංඅුම්' නම් කොට ඇති බව සඳහන් කරමින් ලෝක උරුමයක් ලෙස නම් කිරීමට ඉවහල් වූ කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න.

- 'සෙජොන්' රජු විසින් සිදු කරන ලද මෙම අම්ලමය සේවයට කෘතගුණ සලකනු වස් ඔක්තෝම්බර් මස 9 වන දින 'හන්ගල් දිනය' (한글 날) ලෙස ප්‍රකාශයට පත් කර ඇති බව විස්තර කරමින් එදිනට එය සමරන ආකාරය පැහැදිලි කරන්න.
- යුනෙස්කෝව විසින් UNESCO King Sejong Literacy Prize ලෙස නම් කරන ලද ත්‍යාගයක් සාහිත්‍ය වෙනුවෙන් සේවාවක් කළ පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට ලබා දෙන බව තවදුරටත් පැහැදිලි කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- 'සෙජොන්' රජතුමාගේ ඡායාරූපයක්
- 'හුන්මින්ජොංඅුම්'හි ඡායාරූපයක්

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- කොරියන් අක්ෂර බිහි වීමට පෙර කොරියාවේ පැවති සමාජ පසුබිම, අක්ෂර නිර්මාණය වීමට බලපෑ හේතු හා 'සෙජොන්' රජු පිළිබඳ අසන ප්‍රශ්නවලට පිළිතුරු නිවැරදි ව සැපයීම. (කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ප්‍රශ්න වටයක් පැවැත්වීම)
- 'සෙජොන්' රජගේ පාලන කාලයේ කොරියන් අක්ෂර නිර්මාණය කිරීම මෙන් ම විවිධ ක්ෂේත්‍රයන්හි ඇති වූ පිබිදීම පිළිබඳ තොරතුරු රැස් කර පොත් පිංචක් සැකසීම.

**විමර්ශන**

<한국의 글자와 말>.(문화공보부 해외공보관)

<안녕하세요?>학연문화사) DVDs

<열린 한국어 입문소- 한글을 배워요>

https://www.sejonghakdang.org/korean/textbook/list.do#

https://www.youtube.com/watch?v=lNAfrzPUzWQ

https://www.youtube.com/watch?v=gmWnHuJVp-0

**නිපුණතාව** 2.0 කොරියන් අක්ෂර මාලාව සහ එහි ඓතිහාසික පසුබිම හඳුනා ගෙන භාවිත කරයි

**නිපුණතා මට්ටම** 2.2 ස්වර සහ ව්‍යඤ්ජනවලට සවන් දී ඒ අනුව උච්ඡාරණය කරයි

**කාලච්ඡේද** 04

**ඉගෙනුම් පල**

- ස්වර සහ ව්‍යඤ්ජන උච්චාරණයට සවන් දී ඒවා නිවැරදිව උච්චාරණය කරයි.
- ස්වර සහ ව්‍යඤ්ජන ශබ්ද උච්චාරණ විවිධතා පැහැදිලි වන ලෙස උච්ඡාරණය කරමින් අභ්‍යාසයේ යෙදෙයි.
- මූලික ස්වර සහ සංයුක්ත ස්වර අතර වෙනස දක්වයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- ස්වර හා ව්‍යඤ්ජන එකට එක් වී නිර්මාණය කරන ලද කොරියන් හෝඩිය 'හන්ගල්' ලෙස හැඳින්වෙන අතර කොරියන් භාෂාවේ උච්චාරණ විශේෂතා හා වෙනස්කම් පිළිබඳ අවධානය යොමු කරමින් මූලික ශබ්දවලට සවන් දීමට අවස්ථාව ලබා දෙන්න.
- ශබ්ද සටහන් කරන ලද සටහනක් ඇසුරින් ස්වර හා ව්‍යඤ්ජන ලෙස වෙන් කර දක්වා හඬ පටයට සවන් දෙමින් වෙනස හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- කොරියන් හෝඩිය අකුරු 40කින් සමන්විත වන අතර එය ස්වර(21) හා ව්‍යඤ්ජන(19) ලෙස වෙන් කරන බවත් ඒවා නිර්මාණය වන ආකාරය දක්වා ඒ ශබ්ද ඇසීමට සලස්වන්න.
- ' 예사소리, 된소리, 거센소리 ' අතර ඇති වෙනස පැහැදිලි කිරීමට රූප සටහනක් යොදා ගනිමින් එහි ශබ්ද උච්චාරණයේ දී ඇති වෙනස දක්වන්න.
- ' 예사소리, 된소리, 거센소리 ' වලට අදාළ වචන ඉදිරිපත් කර උච්චාරණ ආභ්‍යාසයේ යෙදීමට අවස්ථාව ලබා දෙන්න.
- ස්වර හා ව්‍යඤ්ජන සුසංයෝග කර සාදන ලද වගුවක් භාවිත කර මාත්‍රාවන් නිවැරදි ව උච්චාරණ කරවන්න.
- හඬ පටවලට සවන් දීමට අවස්ථාව ලබා දී නිවැරදි උච්චාරණ හුරු කරවන්න.
- සංයුක්ත ස්වර උච්චාරණය කිරීමේ දී සමාන ශබ්ද සහිත සංයුක්ත ස්වර ගැන දැනුවත් කරන්න.

| | | |
|---|---|---|
| ㅐ [එ] | ㅔ [එ] | |
| ㅒ [යෙ] | ㅖ [යෙ] | |
| ㅙ [වෙ] | ㅚ [වෙ] | ㅞ [වෙ] |

- සිංහල හා කොරියන් යන භාෂා දෙකෙහි ඇති සමාන ශබ්ද මෙන් ම කොරියානු භාෂාවේ ඇති සිංහල භාෂාවේ නොමැති ශබ්ද පිළිබඳ සිසුන් ශිෂ්‍යයන් සාකච්ඡා කර ඒ ශබ්ද නැවත නැවත ඇසීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- හඬ පට
- පින්තූර කාඩ් පත්
- ස්වර හා ව්‍යඤ්ජන සුසංයෝග කර සාදන ලද වගුවක්
- කොරියන් අක්ෂර මාලාව සහිත පුවරු
- කොරියන් අක්ෂර ලියූ කාඩ් පත්
- කොරියන් වචන ලියූ කාඩ් පත්

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- මූලික ව්‍යඤ්ජන හා ද්විත්ව ව්‍යඤ්ජන අතර ඇති වෙනස දැක්වෙන පරිදි නිවැරදි ව උච්චාරණය කිරිම.
- සමාන ශබ්ද සහිත සංයුක්ත ස්වර හඳුනා ගෙන උච්චාරණය කිරිම.
- ' 예사소리, 된소리, 거센소리 ' අතර වෙනස ඇති වෙන ලෙස වචන උච්චාරණය කිරීම.
- ස්වර හා ව්‍යඤ්ජන නිවැරදි උච්චාරණය සඳහා ඒවා යෙදෙන විවිධ වචන ආශ්‍රයෙන් උච්චාරණ අභ්‍යාසවල යෙදීම.

**විමර්ශන**

<열린 한국어 입문소- 한글을 배워요>


| | |
|---|---|
| **නිපුණතාව** | 2.0 කොරියන් අක්ෂර මාලාව සහ එහි ඓතිහාසික පසුබිම හඳුනා ගෙන භාවිත කරයි |
| **නිපුණතා මට්ටම** | 2.3 නිවැරදි පියවර අනුගමනය කරමින් අක්ෂර ලියයි |
| **කාලච්ඡේද** | 04 |


**ඉගෙනුම් පල**

- ස්වර හා ව්‍යඤ්ජන අක්ෂර රේඛා අනුපිළිවෙළින් ලියයි.
- ස්වර හා ව්‍යඤ්ජන සංයෝග කොට නිවැරදි ව වචන ගොඩනගයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- කොරියන් අක්ෂර ලිවීමේ දී සිරස් හා තිරස් රේඛා ගමන් කළ යුතු දිශාව පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා දෙන්න. සිරස් රේඛාවක් ඇඳීමේ දී ඉහළ සිට පහළට ඇඳිය යුතු බවත් තිරස් රේඛාවක් ඇඳීමේ දී වමේ සිට දකුණට ඇඳිය යුතු බවටත් පැහැදිලි කරන්න.






- අක්ෂරයක් නිර්මාණය කිරීමේ දී ව්‍යඤ්ජන හා ස්වරයක් එක් විය යුතු වන අතර කිසිදු අවස්ථාවක ව්‍යඤ්ජනාක්ෂරයක් තනිව ම හෝ ස්වරාක්ෂරයක් තනිව ම ලිවිය නොහැකි බව විස්තර කරන්න.
- ස්වරාක්ෂරයක් ලිවීමේ දී ඊට පෙර ' ㅇ ' යෙදිය යුතු බව පැහැදිලි කරන්න.
- අක්ෂර ලිවීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි පිළිවෙළ හඳුන්වා දෙමින් ස්වර හා ව්‍යඤ්ජන ලිවීමට පුහුණු කරන්න.
- ස්වර හා ව්‍යඤ්ජන සංයෝග කොට වචනයක් ලියන ආකාරය පුහුණු කරන්න.
- උගත් දේ පැවරුම් පත් ආශ්‍රයෙන් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට
- කොරියන් අක්ෂර මාලාව සහිත පුවරු
- අක්ෂර ලියූ කාඩ් පත්
- වචන සහිත පින්තූර කාඩ් පත්
- පැවරුම් පත්

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- අක්ෂර ලිවීමේ දී රේඛා ගමන් කළ යුතු දිශාව අනුව නිවැරදි ව ලිවීම.
- ස්වර හා ව්‍යඤ්ජන නිවැරදි ව ලිවීම.
- හඬ පටවලට හෝ ගුරුවරයාට සවන් දී නිවැරදි ව අක්ෂර හා වචන ලිවීම.

**විමර්ශන**

<경희 한국어 쓰기 1>,**Get it Korean writing** (Hawoo Publishing Inc.)

<열린 한국어 입문소- 한글을 배워요>

<서울대학교 어학연구소 한국어 교재에 맞추어 엮은 한국어 쓰기 교본>(명지출판사. 2004)

https://www.sejonghakdang.org/korean/textbook/list.do#

**නිපුණතාව** 2.0 කොරියන් අක්ෂර මාලාව සහ එහි ඓතිහාසික පසුබිම හඳුනා ගෙන භාවිත කරයි

**නිපුණතා මට්ටම** 2.4 ස්වර සහ ව්‍යඤ්ජන සම්බන්ධ කිරීමේ රීතීන්වලට අනුව මාත්‍රා ගොඩනඟයි

**කාලච්ඡේද** 04

**ඉගෙනුම් පල**


- එක් එක් උච්චාරණ ඉන්ද්‍රියයන් මඟින් උත්පාදනය වන ශබ්ද වර්ග කර දක්වයි
- ස්වර හා ව්‍යඤ්ජන සංයෝග කොට නිවැරදි ව වචන ගොඩනඟයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- ස්වරයක් නිර්මාණය කිරීමේ දී '(ㅇ), ( ㅣ ), (ㅡ)' යන සංකේත 3 ප්‍රධාන වන අතර එය (අහස), (මිනිසා) හා (පොළව) සංකේතවත් කරනු ලබන බවත් ස්වභාව ධර්මයත් අක්ෂර නිර්මාණය කිරීමේ දී යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.




- ඉහත දැක් වූ සංකේත 3 මුල් කරගෙන ස්වර නිර්මාණය කරනු ලබන බව උදාහරණ මගින් පැහැදිලි කරන්න.




- ශබ්ද උත්පත්ති ස්ථාන ඇසුරින් ව්‍යඤ්ජන අක්ෂර නිර්මාණය වන ආකාරය පිළිබඳ රූප සටහන් යොදා ගනිමින් හඳුන්වා දෙන්න.



- ඉහත දැක් වූ ශබ්ද උත්පත්ති ස්ථාන ඇසුරින් ' ㄱ, ㄴ, ㅁ, ㅅ, ㅇ ' මුල් කර ගෙන තවත් කොටස් එකතු කර අක්ෂර නිර්මාණය කර ගත හැකි බව පහත උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.



ㄱ- ㅋ, ㄲ


ㄴ- ㄷ, ㅌ, ㄹ, ㄸ, ㅂ, ㅍ

ㅁ- ㅂ, ㅍ

ㅅ- ㅈ, ㅊ, ㅆ, ㅉ

ㅇ- ㅎ

- අක්ෂරයක් නිර්මාණය වීමේ දී තිබිය යුතු මූලික කොටස් පිළිබඳ හඳුන්වා දෙන්න.




- ස්වර හා ව්‍යඤ්ජන සංයෝග කොට නිවැරදි ව වචන ගොඩ නැගෙන ආකාරය පැහැදිලි කරන්න.

ㄱ + ㅏ = 가

ㄱ +ㅜ = 구

가 + ㅗ = 고

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට
- පැවරුම් පත්
- කොරියන් අක්ෂර මාලාව සහිත පුවරු
- අක්ෂර ලියු කාඩ් පත්

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- දෙන ලද රූපවලට අදාළ කොරියන් වචනය ලිවීම.
- ස්වර හා ව්‍යඤ්ජන සංයෝග කොට නිවැරදිව වචන ගොඩ නැගීම.

**විමර්ශන**

https://www.youtube.com/watch?v=-knqyipo4-A&vl=ko

https://www.sejonghakdang.org/korean/textbook/list.do#

**නිපුණතාව** 2.0 කොරියන් අක්ෂර මාලාව සහ එහි ඓතිහාසික පසුබිම හඳුනා ගෙන භාවිත කරයි

**නිපුණතා මට්ටම** 2.5 නිවැරදි උච්චාරණය සඳහා දැනගත යුතු උච්චාරණ රීතීන් හඳුනා ගෙන උච්චාරණය කරයි.

**කාලච්ඡේද** 06


**ඉගෙනුම් පල**

- හල් කිරීමට අදාළ නීති රීතිවලට අනුව හල් කිරීමේ ශබ්ද නිවැරදි ව උච්චාරණ කරයි.
- ව්‍යඤ්ජන හා ස්වර සන්ධි වීමේ රීතීන්ට අනුව නිවැරදිව උච්චාරණ කරයි.
- ප්‍රකාශිත වාක්‍ය හා ප්‍රශ්නාර්ථ වාක්‍ය අවසානයේ තානයට අනුව හඬ පාලනය කරමින් කතා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- ශබ්දයක් ඉපදීම සඳහා ස්වර හා ව්‍යඤ්ජන ස්ථාන ගත කළ යුතු ආකාරය පැහැදිලි කර දෙන්න.
- සිංහල භාෂාවේ ඇති හල් කිරීමට සමාන ලෙස 'පත්චිම්' '(받침)' කොරියන් භාෂාවේ භාවිත කරන බව සඳහන් කරන්න.
- සියලු ම ව්‍යඤ්ජන අක්ෂර 'පත්චිම්' ලෙස භාවිත කළ හැකි වුව ද ' ㄸ, ㅃ, ㅉ 'භාවිත නො කරන බව පැහැදිලි කරන්න.
- 'පත්චිම්' ලෙස යෙදෙන අක්ෂරය එකී අක්ෂරයේ හල් අකුර ලෙස පහත පරිදි උච්චාරණය වෙන බව උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

උදා: ㄱ -ක් ㄴ -න් ㅁ -ම්



- මෙසේ අවසාන අක්ෂරය හල් කිරීමක් ලෙස උච්චාරණය වුව ද සෑමවිට ම එසේ සිදු නොවන බවත් උච්චාරණය සිදු වන්නේ ' ㄱ, ㄴ, ㄷ, ㄹ, ㅁ, ㅂ, ㅇ ' යන ශබ්ද මුල් කර ගෙන බවත් පෙන්වා දෙන්න.
- 'පත්චිම්'වල අකුරු අනුව උච්චාරණය වන ආකාරය වගුව යොදා ගනිමින් පැහැදිලි කරමින් උච්චාරණයේ දී අවධානය යොමු කළ යුතු අවස්ථා පිළිබඳ පහදන්න.

| 받침 | 발음 | 예 |
|---|---|---|
| ㄱ, ㄲ, ㅋ | [ㄱ] | 약[약], 밖[박], 부엌[부억] |
| ㄴ | [ㄴ] | 안[안] |
| ㄷ, ㅅ, ㅆ,<br>ㅈ, ㅊ, ㅌ, ㅎ | [ㄷ] | 곧[곧], 옷[옫], 있다[읻따],<br>낮[낟], 꽃[꼳], 밭[받], 히읗[히읃] |
| ㄹ | [ㄹ] | 달[달] |
| ㅁ | [ㅁ] | 밤[밤] |
| ㅂ, ㅍ | [ㅂ] | 밥[밥], 앞[압] |
| ㅇ | [ㅇ] | 강[강] |

- 'පත්චිම්' සහිත වචන ශ්‍රවණය කිරීමට සලස්වා ශිෂ්‍යයන්ට තනිව උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- 'පත්චිම්' සහිත වචන ශ්‍රවණය කිරීමට සලස්වා නිවැරදි ව ලියා ඇති ආකාරය තේරීමට අවස්ථාව ලබා දෙන්න.
- වචන හා අකුරු ලියූ කාඩ් පත් භාවිත කරමින් 'පත්චිම්' සහිත වදන් තවදුරටත් පුහුණු කරන්න.
- ' 겹받침 ' පිළිබඳ සංකල්පය පහදා දී උච්චාරණයේ දී ශබ්ද කළ යුත්තේ කුමන ශබ්දය ද යන්න වගුව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

| 앞 자음이 발음되는 경우 | | |
|---|---|---|
| 받침 | 발음 | 예 |
| ㄳ | [ㄱ] | 몫[목] |
| ㄵ | [ㄴ] | 앉다[안따] |
| ㄶ | [ㄴ] | 많다[만타] |
| ㄼ | [ㄹ] | 넓다[널따] |
| ㄽ | [ㄹ] | 곬[골] |
| ㄾ | [ㄹ] | 핥다[할따] |
| ㅀ | [ㄹ] | 싫다[실타] |
| ㅄ | [ㅂ] | 값[갑] |

| 뒤 자음이 발음되는 경우 | | |
|---|---|---|
| 받침 | 발음 | 예 |
| ㄺ | [ㄱ] | 닭[닥] |
| ㄻ | [ㅁ] | 삶[삼] |
| ㄿ | [ㅂ] | 읊다[읍따] |

- ' 겹받침 ' හා සම්බන්ධ වචන ශ්‍රවණය කිරීමට සලස්වා උච්චාරණයේ දී ශබ්දය වන්නේ කිනම් ශබ්දය ද යන්න අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- උච්චාරණයේ දී ඇති අවධානය යොමු කළ යුතු නීතී පිළිබඳ පැහැදිලි කරන්න.

උදා: -'[의]' උච්චාරණයේ දී නාම පද සමඟ යෙදේ නම් ' 에 'බවට පත් වී උච්චාරණ වන බව පැහැදිලි කරන්න. ' 수진 씨의 책- 수진 씨에 책 '

-'[ㅂ]ㄴ ' සමඟ එක් වීමේ දී ' ㅁ ' බවට පත් වී උච්චාරණ වන බව පැහැදිලි කරන්න.

' 입니다- [임니다]'

- ' ㄱ, ㄷ, ㅂ ' පිටුපසින්' ㄱ, ㄷ, ㅂ, ㅅ, ㅈ ' පැමිණෙන්නේ නම් '[ㄲ, ㄸ, ㅃ, ㅆ, ㅉ] ' බවට පත් වී උච්චාරණ වන බව පැහැදිලි කරන්න.


' 학교- [학꾜]' ' 학생- [학쌩]'

- මුලින් යෙදෙන වචනයේ 'පත්චිම්'වලින් අවසන් වී ඉන්පසුව ස්වරයක් පැමිණෙන්නේ නම් මුලින් යෙදී ඇති 'පත්චිම්'හි අවසානයේ ඇති අකුර ස්වරය සමඟ එක් වී එහි ශබ්දය ඇති කරන බව පැහැදිලි කරන්න.

일요일- [이료일] 월요일- [워료일]

- ප්‍රකාශිත වාක්‍ය හා ප්‍රශ්නාර්ථ වාක්‍ය අවසානය අනුව හඬ වෙනස් වීම පිළිබඳ උදාහරණය දක්වමින් පැහැදිලි කරන්න.

උදා:




- ප්‍රකාශිත වාක්‍ය හා ප්‍රශ්නාර්ථ වාක්‍ය අවසානයේ යෙදීම අනුව උච්චාරණයේ ඇති වන වෙනස හඳුනා ගෙන උච්චාරණයේ යෙදීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- අක්ෂර ලියූ කාඩ් පත්
- වචන ලියූ කාඩ් පත්
- 'පත්චිම්' වචන සහිත පින්තූර කාඩ් පත්
- 'පත්චිම්' නීති දක්වා ඇති වගුව
- ' 겹받침 ' දක්වා ඇති වගුව

- පැවරුම් පත්
- ප්‍රකාශිත වාක්‍ය හා ප්‍රශ්නාර්ථ වාක්‍ය ලියන ලද කාඩ් පත්
- උච්චාරණයේ දී අවධානය යොමු කළ යුතු අවස්ථා සහිත වාක්‍ය, ඡේද ඇති කාඩ් පත්

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- කණ්ඩායම් ක්‍රියාකරකමක් ලෙස අක්ෂර කාඩ් පත් භාවිත කරමින් ගුරුවරයා පවසන වචන සෑදීමේ ක්‍රියාකාරකම්, වචන පැවසූ විට නිවැරදි ව පින්තූරය සෙවීම වැනි ක්‍රියාකාරකම්වල යෙදීම.
- 'පත්චිම්' සහිත වචන හා රහිත වචන යෙදුණු වාක්‍ය කියවීම.
- ප්‍රකාශිත වාක්‍ය හා ප්‍රශ්නාර්ථ වාක්‍ය අවසානයේ යෙදෙන ආකාරය අනුව නිවැරදි ව උච්චාරණය කරමින් සංවාදවල යෙදීම.
- උච්චාරණයේ දී අවධානය යොමු කළ යුතු අවස්ථා සහිත වාක්‍ය, ඡේද කියවීම.

**විමර්ශන**

<열린 한국어 입문소- 한글을 배워요>

<세종한국어1,3->국립국어원

https://www.youtube.com/watch?v=D2R8JxiX9ek

**නිපුණතාව** 3.0 සවන් දී ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** 3.1 එදිනෙදා ජීවිතයේදී නිතර භාවිත වන යෙදුම්වලට සවන් දී අවබෝධ කරගෙන නිවැරදිව ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** 12

**ඉගෙනුම් පල**
- ආචාර කිරීම්, ස්තුති කිරීම්, සමාව ගැනීම්, අණ කිරීම්, උපදෙස් යනාදී අවස්ථාවලට අදාළ යෙදුම්වලට සවන් දී අවස්ථානුකූල ව ප්‍රතිචාර දක්වයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- නිර්දිෂ්ට ග්‍රන්ථය සමග ලබා දී ඇති සංයුක්ත තැටියේ සවන් දීමේ අභ්‍යාසයන්ට සවන් දීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසන්න.
- එම කොටස්වල ඇති ආචාර කිරීම්, ස්තුති කිරීම්, සමාව ගැනීම්, අණ කිරීම්, උපදෙස් යනාදී අවස්ථාවලට අදාළ යෙදුම්වලට සවන් දී අර්ථය අවබෝධ කරවන්න.
- පෙළ පොතේ දී ඇති පන්ති කාමරයේ නිතර භාවිත වන යෙදුම් හා ආචාර කිරීම් (ස්තුති කිරීම්, සමාව ගැනීම් යනාදිය) නැවත සවන් දී නිවැරදි උච්චාරණයට හුරු කරවන්න.
- එම අවස්ථාවලට අනුකූල ව ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳ ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කර අභ්‍යාස කිරිමට අවස්ථාව සලසා දෙන්න.
- උගත් යෙදුම් හා ආචාර කිරීම් යනාදිය ප්‍රායෝගික ව භාවිත කළ හැකි ආකාරයට ක්‍රියාකාරකම්වල නිරත වීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**
- වීඩියෝ දර්ශන
- හඬ පට
- සංවාද ඇතුළත් පත්‍රිකා

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**
- උගත් යෙදුම් හා ආචාර කිරීම්වලට සවන් දී අදාළ ව ප්‍රතිචාර දැක්වීම.
- යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් ගුරුවරයා ලබා දෙන අවස්ථාවට අනුකූල ව ප්‍රතිචාර දැක්වීම.

  උදා: ආචාර කිරීම්, අණ කිරීම්, උපදෙස්

**විමර්ශන**

- TOPIK 한국어능력시험 - https://www.topik.go.kr
- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org
- Learn Teach Korean - https://www.youtube.com/user/LearnTeachKorean

**නිපුණතාව** 3.0 සවන් දී ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** 3.2 එදිනෙදා ජීවිතය හා සම්බන්ධ මූලික සංවාද අවස්ථාවන්ට සවන් දී අවබෝධ කරගෙන නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** 14

**ඉගෙනුම් පල**

- දෛනික හා විධිමත් සංවාදවලට සවන් දී අවශ්‍ය තොරතුරු අවබෝධ කරගෙන ප්‍රශ්න ඇසීම හා පිළිතුරු දීම සිදු කරයි.
- සංවාදයේ ඇතුළත් තොරතුරු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.
- සවන් දී තොරතුරු අවබෝධ කර ගෙන උපදෙස් අනුව කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- ' 듣고 말해요 ' වලට අදාළ සංවාද හෝ ඡේදවලට සවන් දීමට අවස්ථාව සලසන්න.
- පැහැදිලි කිරීමට පෙර අන්තර්ගතයට අදාළ සරල ප්‍රශ්න අසන්න.

උදා: 무슨 상황이에요?

누가 이야기하고 있어요?

- ' 듣고 말해요 ' වලට අදාළ සංවාද හෝ ඡේද කියවමින් නැවත සවන් දීමට අවස්ථාව සලසා දෙන්න.
- නොදන්නා වචන හෝ යෙදුම්වල අර්ථය තනි ව අනුමාන කර ගැනීමට කාලය ලබා දෙන්න.
- ශිෂ්‍යයන් සමග අර්ථය සාකච්ඡා කරන්න.
- සවන් දුන් අන්තර්ගතය පිළිබඳව ශිෂ්‍යයන්ට අදහස් දැක්වීමට අවස්ථාව සලසන්න.
- සවන් දීමට අදාළ පෙළ පොතේ දී ඇති අභ්‍යාසවල යොදවන්න.
- අන්තර්ගතය අදාළ තොරතුරු සංක්ෂිප්ත ව ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- හඬ පට
- සංවාද ඇතුළත් පත්‍රිකා

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- අනුපිළිවෙළින් තොර සංවාදයකට සවන් දී අනුපිළිවෙළට සැකසීම
    - එදිනෙදා ජීවිතයට අදාළ ප්‍රායෝගික අවස්ථාවලට අනුව සංවාදයේ යෙදීම.
    - අසා ලිවීම.

**විමර්ශන**

- TOPIK 한국어능력시험 - https://www.topik.go.kr
- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org
- Learn Teach Korean - https://www.youtube.com/user/LearnTeachKorean

**නිපුණතාව** 4.0 ව්‍යාකරණ රටා අවස්ථානුකූල ව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 4.1 ව්‍යාකරණ රටාවල ස්වරූපය, අර්ථය සහ භාවිත වන අවස්ථා අධ්‍යයනය කර නිවැරදි වාක්‍ය ගොඩ නගයි.

**කාලච්ඡේද** 60

**ඉගෙනුම් පල**

- උගත් ව්‍යාකරණ රටා ව්‍යතිරේක ව යෙදෙන අවස්ථා පිළිබඳව සැලකිලිමත් වෙමින් ඒවා නිවැරදි ව වාක්‍යවල යොදයි.
- ව්‍යාකරණ රටාවල අර්ථය පැහැදිලි වන අයුරින් අර්ථවත් සරල වාක්‍ය නිර්මාණය කරයි.
- උගත් සම්බන්ධීකාරක ව්‍යාකරණ රටා නිවැරදි ව යොදා ගනිමින් වාක්‍ය සම්බන්ධ කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- ඉගැන්වීමට නියමිත ව්‍යාකරණ රටාව ඍජුව හඳුන්වා නොදී උදාහරණ සජීවී, අජීවී වස්තු හෝ පින්තූර වැනි දෑ භාවිත කරමින් ඉගෙනීමට නියමිත පාඩම පිළිබඳ යම් ඉඟියක් ලබා දෙමින් පාඩමට අවතීර්ණ වන්න.

උදා : 1. N이/가 아니에요 ව්‍යාකරණ රටාව ඉගැන්වීමේ දී,

පංතිකාමරයේ ඇති භාණ්ඩ පෙන්වමින්, (ඔරලෝසුව)

교사 : 이게 카메라예요?

학생 : 아니요. 시계예요.

교사 : 맞아요. 이게 카메라**<u>가 아니에요</u>**. 시계예요.

උදා : 2. A/V 아서/어서 ව්‍යාකරණ රටාව ඉගැන්වීමේ දී,

පුද්ගලයෙකු රෝහලට යන පින්තූරයක් පෙන්වමින්,

교사 : 이 사람은 왜 병원에 가요?

학생 : 머리가 아파요.

교사 : 네. 머리가 **아파요. 그래서** 병원에 가요.

머리가 **아파서** 병원에 가요.

- අදාළ ව්‍යාකරණ රටාවේ ස්වරූපය සහ මූලික නීති රීති පිළිබඳ පැහැදිලි කරන්න.

'උදා : V (으)세요 ' ව්‍යාකරණ රටාව ඉගැන්වීමේ දී,

මූලික නීති - '받침' වලින් අවසන්වන ක්‍රියා පදයක් නම් '(으)세요' ද,

'받침' නොමැති ක්‍රියා පදයක් නම් '-세요' ද යෙදෙයි.

- අදාළ ව්‍යාකරණ රටා ව්‍යතිරේක ව යෙදෙන අවස්ථා පිළිබඳව අවබෝධය ලබා දෙන්න.

උදා : 1. V (으)세요 ව්‍යාකරණ රටාව ඉගැන්වීමේ දී,

'먹다/마시다' වෙනුවට '드시다' යන්නත් '자다'

වෙනුවට '주무시다' යන්නත් '있다' වෙනුවට '계시다'

යන්නත් යෙදේ.

먹다/ 마시다 – 먹으세요(X), 마시세요(X)

드세요 (√)

උදා: 2. ㅂ 불규칙

춥다 – 추워요

덥다 – 더워요

- ව්‍යාකරණ රටාව යෙදෙන අයුරු නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

උදා : 'V (으)세요 ' ව්‍යාකරණ රටාව ඉගැන්වීමේ දී,

' 빨리 오세요.'

맛있게 드세요

- උගත් ව්‍යාකරණ රටා ප්‍රගුණ කරවීම සඳහා සුදුසු පරිදි අභ්‍යාස හා ක්‍රියාකාරකම්වල යොදවන්න.

උදා: පෙළ පොතේ ඇති අභ්‍යාස, ව්‍යාකරණ රටාව ලබා දී නිවැරදි ව වාක්‍ය ගොඩ නැගීම, සදොස් වාක්‍ය නිදොස් කොට ලිවීම

- උගත් ව්‍යාකරණ රටා අඩංගු කොරියන් නාට්‍ය හෝ ගීත කොටස් ඇසීමට සලස්වා එකී ගීත කණ්ඩ හෝ දෙබස් සම්පූර්ණ කිරීම, නැවත ගායනය කිරීම හෝ නිරූපණය කිරීම වැනි ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වචන ලියූ කාඩ්පත්
- ව්‍යාකරණ රටා ලියන ලද කාඩ්පත්
- පින්තූර
- හඬපට
- වීඩියෝ දර්ශන
- සජීව නිදර්ශක
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක :**

- ව්‍යාකරණ රටා නිවැරදි ව යොදා ගනිමින් වාක්‍ය ගොඩනැගීම හා සම්බන්ධ කිරීම.
- උගත් ව්‍යාකරණ රටා භාවිත කරමින් සරල ඡේද හෝ රචනා ලිවීම.

**විමර්ශන**

- TOPIK 한국어능력시험 - https://www.topik.go.kr
- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org
- Learn Teach Korean - https://www.youtube.com/user/LearnTeachKorean

**නිපුණතාව** 4.0 ව්‍යාකරණ රටා අවස්ථානුකූල ව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 4.2 දෛනික කටයුතුවල දී භාෂා ප්‍රකාශනය සඳහා උපයෝගී වන ව්‍යාකරණ රටා අවස්ථානුකූල ව භාවිත කරයි.

**කාලච්ඡේද** 30

**ඉගෙනුම් පල**

- නාම පද හා ගණනය කිරීමේ ඒකක නිවැරදිව ගළපා ගනිමින් ගණනය කරයි.
- භාෂාවේ විධිමත් සහ අවිධිමත් ස්වරූපය අවස්ථා අනුව භාවිත කරමින් වාක්‍ය ගොඩ නගයි.
- නිපාත පද, කාල භේදය, වාක්‍ය සම්බන්ධ කිරීම, වාක්‍ය අවසන් කිරීම ආදී ව්‍යාකරණ රටා සහ යෙදුම් අවස්ථානුකූල ව භාවිත කර භාෂා ප්‍රකාශනයේ යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- උගත් ගණනය කිරීමේ ඒකක ප්‍රායෝගික ව භාවිත වන ආකාරය පුහුණු කරවීම සඳහා සුදුසු පරිදි ක්‍රියාකාරකම්වල යොදවන්න
- උදා: ගණනය කිරීමේ ඒකක නිවැරදි ව භාවිත කළ හැකි ප්‍රශ්නාවලියක් සකසා ප්‍රශ්න වටයක් පැවැත්වීම '몇 살이에요?/ 몇 시에 일어나요?/ 가족이 몇 명이에요?'
- පුද්ගලයාගේ වයස, සමාජ මට්ටම සහ අවස්ථාව අනුව භාෂාව විධිමත් ව හෝ අවිධිමත් ව භාවිත කළ යුතු ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. එකිනෙකට වෙනස් අවස්ථා කිහිපයක් ලබා දී ඒ ඒ අවස්ථාවට උචිත පරිදි සංවාද ගොඩනැගීමට ශිෂ්‍යයන් යොමුකරන්න.
  උදා : පළමු වරට යම් පුද්ගලයෙක් හමුවීම, වයසින් වැඩි පුද්ගලයෙක් සමඟ සරල සංවාදයක යෙදීම, පිරිසක් ඉදිරියේ කතාවක් පැවැත්වීම, යහළුවෙකු සමඟ කතා කිරීම
- භාෂාව විධිමත් සහ අවිධිමත් ව හසුරවන ආකාරය දැක්වෙන කොරියන් නාට්‍ය කොටස්, ප්‍රවෘත්ති නිවේදන ආදිය නැරඹීමට අවස්ථාව ලබා දී එක් එක් අවස්ථාවල දී භාෂාව යෙදෙන ආකාරය නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- දෛනික ජීවිතයේ විවිධ අවස්ථාවල දී උගත් ව්‍යාකරණ රටා නිවැරදි ව භාවිත කරමින් භාෂාව හසුවන ආකාරය සංවාද ඇසුරෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

උදා :

▶අතීතයේ සිදු වූ සිදුවීමක් යහළුවෙකුට විස්තර කිරීම

학생 1 ඵ 주말에 뭐 했어요?

학생 2 : 친구 집에 갔어요. 친구 집에서 공부하고 영화를 봤어요.

학생 1 : 어떤 영화를 봤어요?

학생 2 : 한국 액션 영화를 봤어요.

▶ පාසලට ප්‍රමාද වී පැමිණීම පිළිබඳ හේතු දැක්වීම

교사: 아루니 씨, 오늘 왜 늦었어요?

학생 : 지갑을 잃어버려서 늦었어요.

**ගුණාත්මක යෙදවුම්** :

- වචන ලියූ කාඩ්පත්
- පින්තූර
- හඬපට
- වීඩියෝ දර්ශන
- සජීව නිදර්ශක
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- නිවැරදි ගණනය කිරීමේ ඒකක භාවිත කරමින් පින්තූරයක් විස්තර කිරීම.
- විවිධ අවස්ථා දැක්වෙන කාඩ්පත් ලබා දී ඒ ඒ අවස්ථාවට උචිත පරිදි භාෂාව භාවිත කරමින් සංවාද ගොඩනැගීම. (භාෂාව විධිමත් ව හා අවිධිමත් ව හැසිරවීම)
- උගත් ව්‍යාකරණ නිවැරදි ව භාවිත කර දෙන ලද මාතෘකා ඇසුරින් සරල රචනා ලිවීම.

**විමර්ශන**

- TOPIK 한국어능력시험 - https://www.topik.go.kr
- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org
- Learn Teach Korean - https://www.youtube.com/user/LearnTeachKorean

**නිපුණතාව** 4.0 ව්‍යාකරණ රටා අවස්ථානුකූල ව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 4.3 සමාන ලක්‍ෂණ පෙන්නුම් කරන ව්‍යාකරණ රටාවල පවතින වෙනස්කම් අවබෝධ කර ගනිමින් අවස්ථානුකූල ව භාවිත කරයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- සමාන ලක්ෂණ ඇති ව්‍යාකරණ රටා අවස්ථානුකූල ව නිවැරදි ව භාවිතා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- සමාන ලක්‍ෂණ පෙන්නුම් කරන ව්‍යාකරණ රටා හඳුන්වා දෙන්න.

උදා : ▶ -고, -아서/어서

▶ 안, 못, -지 않다

▶ -고 싶다, -고 싶어하다

▶ 부터~까지, 에서~까지

- එකී ව්‍යාකරණ රටා භාවිතයේ දි එකිනෙකට වෙනස් වන ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

උදා :

▶ 친구를 **만나고** 영화를 봤어요.

친구를 **만나서** 영화를 봤어요.

▶ 공부 **안 해요** / 공부**하지 않아요.**

공부 **못** 해요.

▶ 저는 한국에 가**고 싶어요.**

친구가 한국에 가**고 싶어해요.**

▶ 1시**부터** 2시**까지**

서울**에서** 부산**까지**

- උගත් ව්‍යාකරණ රටා ප්‍රගුණ කරවීම සඳහා සුදුසු පරිදි අභ්‍යාසවල යොදවන්න.

උදා : නිවැරදි ව්‍යාකරණ රටාවට අනුව වාක්‍ය සෑදීම.

වාක්‍ය කිහිපයක් ලබා දී සදොස් / නිදොස් වාක්‍යය තේරීම.

**ගුණාත්මක යෙදවුම්**

- වචන ලියූ කාඩ්පත්
- පින්තූර
- වීඩියෝ දර්ශන
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක** :

- සමාන ලක්ෂණ ඇති ව්‍යාකරණ රටා භාවිත කර වාක්‍ය / ඡේද සම්පූර්ණ කිරීම.
- උගත් ව්‍යාකරණ රටා නිවැරදි ව භාවිත කරමින් පින්තූර විස්තර කිරීම.

**විමර්ශන :**

- TOPIK 한국어능력시험 - https://www.topik.go.kr
- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org
- Learn Teach Korean - https://www.youtube.com/user/LearnTeachKorean

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා නිරවුල් ව සන්නිවේදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.1 දෛනික ජීවිතයට අවශ්‍ය තොරතුරු සහ අදහස් හුවමාරු කර ගනිමින් සංවාදයේ යෙදෙයි.

**කාලච්ඡේද** 15

**ඉගෙනුම් පල**

- සාමාන්‍ය ජීවිතයේ නිතර භාවිත වන ආචාර දැක්වීම, ස්තුති කිරීම, සමාව ගැනීම යනාදී අවස්ථාවලට අදාළ යෙදුම් සන්නිවේදනය සඳහා නිවැරදි ව භාවිත කරයි.
- දෛනික කටයුතු පිළිබඳ ව ප්‍රශ්න අසයි.
- දෛනික කටයුතු පිළිබඳ ව අසන ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු දෙයි.
- දෛනික කටයුතු පිළිබඳ කෙටි දෙබස්, සංවාදවල යෙදෙමින් තොරතුරු හා අදහස් හුවමාරු කර ගනියි.
- සරල ව එක් වාක්‍යයකින් විධානයක් දක්වයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- 말하기 ක්‍රියාකාරකම්වලට අදාළ සංවාද ශිෂ්‍යයන් සමග කියවා ඒ පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.
- දී ඇති සංවාදය පුහුණු වීමට (Role Play) අවස්ථාව ලබා දෙන්න.
- ලබා දී ඇති නිදර්ශන (보기) ඇසුරෙන් සංවාදයක් ගොඩ නැගීමට යොමු කරවන්න. මෙහිදි ලබා දී ඇති පින්තූර, වචන, යෙදුම් යනාදිය මුල් කර ගෙන සංවාදය ගොඩ නැගීමට උපදෙස් ලබා දෙන්න.
- පෙළ පොතෙහි සඳහන් අවස්ථා පංති කාමරය තුළ නිර්මාණය කර (ආචාර දැක්වීම, භාණ්ඩ මිල දී ගැනීම්, ආහාර ඇනවුම් කිරීම, ස්ථාන හඳුන්වා දීම, සැලසුම් පිළිබඳ කතා කිරීම ආදිය) ප්‍රායෝගික ව භාෂණයේ යෙදීමට අවස්ථාව සලසන්න.
- උගත් ව්‍යාකරණ හා යෙදුම් භාවිත කර කෙටි නාට්‍ය නිර්මාණය කර රඟ දැක්වීමට යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සංවාද සහිත හඬ පට
- වීඩියෝ දර්ශන
- විවිධ අවස්ථා නිරූපණය වන රූප කාඩ් පත්
- සංවාද ලියූ කාඩ් පත්

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක :**

- පාඩම ආරම්භයේ ඇති පින්තූරය හෝ විවිධ අවස්ථා නිරූපණය වන රූප කාඩ් පත් ආශ්‍රයෙන් සංවාද ගොඩ නැගීම.
- වාර අවසානයේ හෝ මාසිකව වාචික පරීක්ෂණය පැවැත්වීම.

**විමර්ශන**

- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org
- Learn Teach Korean - https://www.youtube.com/user/LearnTeachKorean

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා නිරවුල් ව සන්නිවේදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.2 දෙන ලද විවිධ මාතෘකා ඇසුරින් සරල කතා ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** **15**

**ඉගෙනුම් පල**

- පෞද්ගලික තොරතුරු ඉදිරිපත් කරමින් තමා හඳුන්වා දෙයි.
- තමා අවට ඇති දෙයක්, කෙනෙක් හෝ පින්තූරයක් බලා ඉතා සරල ව ඒ පිළිබඳව විස්තර කරයි.
- තමා හා සමීප වටපිටාවට අදාළ මාතෘකා සම්බන්ධයෙන් වැකි කිහිපයකින් විස්තර කරයි.
- විවිධ අවස්ථාවන් පිළිබඳව තම අත්දැකීම් විස්තර කරයි.
- තම දින චර්යාව විස්තර කරයි.
- කාලගුණය/දේශගුණය සරල ව විස්තර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- විවිධ මාතෘකා ලබා දී සරල කතා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒ ඒ මාතෘකාවලට අදාළ යෙදුම්, වචන, ක්‍රියා පද, ව්‍යාකරණ රටා, විශේෂණ පද පිළිබඳව විස්තර කරන්න.

  උදා: 자기소개, 하루 일과, 주말 활동, 방학 계획, 좋아하는 한국 음식

- පින්තූරයක් ලබා දී තමාට පෙනෙන දෑ පිළිබඳ සරල බසින් කතා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දෛනික ජීවිතයේ විවිධ අවස්ථාවලට අදාළ සංවාද ගොඩ නැගීමට උපදෙස් දෙන්න.

  උදා: 친구의 근황 물어보기, 방학 계획, 졸업

- පින්තූර ආශ්‍රයෙන් සරල කතා ගොඩ නැගීමට අවස්ථාව ලබා දෙන්න.
- කොතරම් දුරට අනෙක් ශිෂ්‍යයන් ඉදිරිපත් කළ කතාව අවබෝධ කර ගෙන ඇත්දැයි ඒ ආශ්‍රිත ප්‍රශ්න අසා පරීක්ෂා කර බලන්න.
- උගත් ව්‍යාකරණ හා යෙදුම් භාවිත කර නිර්මාණය කළ සරල කතා පාසල් භාෂා දිනයේ දී ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ අවස්ථාවන් නිරූපණය වන රූප කාඩ් පත්
- සංවාද ලියූ කාඩ් පත්
- සජීවී නිදර්ශක (ගුරුවරයා, ශිෂ්‍යයා)
- ව්‍යාකරණ රටා ලියන ලද කාඩ් පත්
- කාවිවිධ මාතෘකා ලියූ

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක :**

- අහඹු ලෙස තෝරා ගන්නා ලද කාඩ් පත්හි ලියා ඇති මාතෘකාවට අදාළ ව සරල කතාවක් ඉදිරිපත් කිරීම.
- කවීක තරගයක් පැවැත්වීම.

**විමර්ශන**

- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org
- Learn Teach Korean - https://www.youtube.com/user/LearnTeachKorean

**නිපුණතාව** 6.0 අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.

**නිපුණතා මට්ටම** 6.1 වචන හා වාක්‍ය නිවැරදි ව කියවයි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- වචන සහ වාක්‍ය ඛණ්ඩ අවශ්‍ය තැන්වල දී නිවැරදි ව වෙන් කර කියවයි.
- හඬ හා අක්ෂර වෙනස් වන ස්ථාන හඳුනා ගෙන නිවැරදි ව කියවයි.
- වාක්‍ය නිවැරදි ව කියවයි.
- වාක්‍ය, ඡේද, රචනා සහ සංවාද නිවැරදි ව ශබ්ද නඟා කියවයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

• වචන සහ වාක්‍ය කියවීමේ දී උච්චාරණය අපහසු ස්වර හා ව්‍යඤ්ජන ශබ්ද පිළිබඳ අවධානය යොමු කරමින් ඒවා නිවැරදි ව උච්චාරණය කිරීමට සලස්වන්න'

උදා( ㅗ/ㅓ, ㅛ/ㅕ

ㄱ,ㅋ,ㄲ/ ㄷ,ㅌ,ㄸ

• ස්වර හා ව්‍යඤ්ජන සංයෝගය පිළිබඳ අවබෝධයෙන් යුතු ව කියවීමට සලස්වන්න

උදා( 들으세요 ‍ෟ드르세요%

읽어요 ‍ෟ일거요%

• ලියා ඇති ආකාරයට වඩා වෙනස් අයුරින් උච්චාරණය වන අවස්ථා තිබේ නම්, ඒවා නිවැරදි ව උච්චාරණය කළ යුතු ආකාරය පැහැදිලි කරන්න'

උදා( 박물관 [방물관]

어머니의 우산 [어머니에 우산]

• ස්වර හා ව්‍යඤ්ජන සංයෝගය, හල් කිරීම් යනාදිය හුරුකළ යුතු බැවින් වචන සහ යෙදුම් ලියූ කාඩ්පත් නිතර පෙන්වමින් ඒවා හඬනගා කියවීමට සලස්වන්න.

• හඬ උස් පහත් වීම" විරාමය ආදි උච්චාරණ රීති පිළිබඳව අවධානය යොමු කරමින් කියවීමට සලස්වන්න

උදා: හඬ උස් පහත් වීම - 한국에 가요. / 한국에 가요?

විරාමය - 아버지가방에들어가신다

• ජේද, රචනා සහ සංවාද ආදිය ශබ්ද නගා කියවීමට අවස්ථාව ලබා දෙන්න.

• වචන, යෙදුම්, වාක්‍ය යනාදිය නිවැරදි ව හා ඉක්මනින් කියවන්නේදැයි බැලීමට හැකි වන ආකාරයේ ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් යොදවන්න.

උදා: අඩුම කාලයක් තුළ නිවැරැදි ව වැඩිම වචන ප්‍රමාණයක් කියවන කණ්ඩායම සෙවීම

**ගුණාත්මක යෙදවුම්**

- පත්‍රිකා (ලිපි, දැන්වීම්, සංවාද, රචනා ආදිය)
- වචන ලියූ කාඩ්පත්
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- උගත් උච්චාරණ රීති පිළිබඳ අවධානය යොමු කරමින් නිවැරදි ව ශබ්ද නගා කියවීම.

**විමර්ශන**

- 국립국어원 - https://www.korean.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org

**නිපුණතාව** 6.0 අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.

**නිපුණතා මට්ටම** 6.2 කියවා අවබෝධ කරගනියි.

**කාලච්ඡේද** 14

**ඉගෙනුම් පල**

- දෛනික ජීවිතයට අදාළ සුබ පැතුම් පණිවිඩ, ලිපි සහ විද්‍යුත් ලිපි ආදිය අන්තර්ගතය අවබෝධ කර ගනිමින් කියවයි.
- සරල ඡේද, ලිපි, රචනා, දැන්වීම් යනාදිය ඇසුරෙන් අසන ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සපයයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- සරල ඡේද, ලිපි රචනා දැන්වීම් යනාදිය කියවීමේ දී අර්ථය නොදන්නා වචන තිබේ නම්, පළමුව ඒ ආශ්‍රිත අනෙකුත් වචන සහ යෙදුම් මඟින් අර්ථය අනුමාන කිරීමට සිසුන් යොමු කරන්න.
- ඉන් පසුව නොදන්නා වචනල අර්ථය දැන ගැනීම සඳහා ශබ්දකෝෂ භාවිත කිරීමට යොමු කරන්න
- කියවී ම මෙන් අර්ථය ග්‍රහණය කිරීමේ දී තම පූර්ව/පසුබිම් දැනුම මත පදනම් ව සමස්ත අර්ථය වටහා ගැනීමට හැකි වන අයුරින් ශිෂ්‍යයන් පුහුණු කරන්න.
- බහු අර්ථ පද අන්තර්ගත වාක්‍ය, ඡේද කියවීමට සලස්වා ඒවායේ අර්ථය අවබෝධ කර ගැනීමට සහයවන්න.
- සමස්තය මගින් තමාට අවශ්‍ය තොරතුරු උපුටා අසන ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකි වන අයුරින් සුදුසු අභ්‍යාස කරන්න'
- කියවා අර්ථය අවබෝධ කරගත්තේ ද යන්න ඇගයීමට හැකි විවිධ ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමුකරන්න.
- කියවා අවබෝධ කරගත් දැනුම ඇසුරෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න'
- අමතර කියවීම් සඳහා සරල ඡේද, දැන්වීම්, විද්‍යුත් ලිපි, බිල්පත් යනාදිය ලබා දෙන්න.

(කොරියන් භාෂා ප්‍රවීණතා විභාගයේ පසුගිය ප්‍රශ්න පත්‍ර ද අමතර කියවීම් සඳහා යොදා ගත හැක.)

**ගුණාත්මක යෙදවුම්**

- වචන ලියූ කාඩ්පත්
- පත්‍රිකා (අමතර කියවීම් සඳහා)
- කොරියන් භාෂා ප්‍රවීණතා විභාගයේ පසුගිය ප්‍රශ්න පත්‍ර (අමතර කියවීම් සඳහා)
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක**

- අමතර කියවීම් සඳහා වන ලිපි ඡේද යනාදිය ඉදිරිපත් කර ඒ ආශ්‍රයෙන් සරල ප්‍රශ්න ඇසීම.

- උගත් ඡේදවල අලුත් යෙදුම්, වචන නැවත භාවිතයේ යෙදිය හැකි ආකාරයට ඡේද හිස්තැන් පිරවීමේ අභ්‍යාස කිරීම

**විමර්ශන**

- TOPIK 한국어능력시험 - https://www.topik.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org

**නිපුණතාව** 6.0 අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.

**නිපුණතා මට්ටම** 6.3 කියවා තොරතුරු සාරාංශ ගත කරයි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- සරල ඡේද, ලිපි, රචනා, දැන්වීම් ආදිය කියවා උපුටා ගත් තොරතුරු සාරාංශ ගත කරයි.
- ඡේද, ලිපි යනාදිය කියවා සරල වාක්‍ය කීපයකින් ඒ පිළිබඳ ව අදහස් දක්වයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- කියවීමේ දී තමාට අවශ්‍ය තොරතුරු රැස් කර කාල කළමණාකරණය සඳහා කියවීමේ ශිල්පිය ක්‍රම යොදා ගත හැකි ආකාරය පිළිබඳ හඳුන්වා දි ඒ සඳහා ශිෂ්‍යයන් පුහුණු කරන්න.

  - Scanning / Skimming
- එම ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් අවශ්‍ය තොරතුරු උපුටා සාරාංශ ගත කිරීමට හැකි වන අයුරින් විවිධ ක්‍රියාකාරකම් සහ අභ්‍යාස කරන්න
- ලිඛිත සහ වාචික ක්‍රියාකාරකම්

**ගුණාත්මක යෙදවුම්**

- පත්‍රිකා
- පොත්/සඟරා
- PPT

**තක්සේරුව සහ ඇගැයීම් සඳහා වන නිර්ණායක :**

- සමස්තය තුළින් අවශ්‍ය තොරතුරු උපුටා ගෙන සංක්ෂිප්ත ව ඉදිරිපත් කිරීම.

**විමර්ශන**

- TOPIK 한국어능력시험 - https://www.topik.go.kr
- 누리세종학당 - https://www.sejonghakdang.org

**නිපුණතාව** 7.0 ලිඛිත ව අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම** 7. 1 අදහස් ක්‍රමානුකූල ව පෙළගස්වමින් ව්‍යාකරණානුකූල ව සහ අර්ථාන්විත ව ලියයි

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- නිවැරදි අක්ෂර වින්‍යාසයට අනුව වාක්‍ය ලියයි.
- දෙන ලද වාක්‍ය රටාවකට අනුව ව්‍යාකරණානුකූල සහ අර්ථාන්විත සරල වාක්‍ය ගොඩ නගයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- ඇසෙන වචන මුල් කර ගෙන නිවැරදි අක්ෂර වින්‍යාස නිතීවලට අනුව වාක්‍ය නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දෙන ලද වාක්‍ය රටාවට අනුව ව්‍යාකරණානුකූල සහ අර්ථාන්විත වාක්‍ය ලිවීමට උපදෙස් දෙන්න.
- දෙන ලද වාක්‍ය, ජේද කියවා ඒ ආකෘතියට සමාන ව තම අදහස් පෙළ ගැස්වීමට අවස්ථාව දෙන්න.
- ලියන ලද වාක්‍ය, ජේද පන්තිය ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- රූප සහිත කාඩ් පත්
- වචන ලියූ කාඩ් පත්
- ආකෘතීන්ට අදාළ ව සරල වාක්‍ය, ජේද ලියූ කාඩ් පත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- දෙන ලද ආකෘතියට අනුව අර්ථාන්විත සරල වාක්‍ය ලිවීම.
- ලියන ලද වාක්‍ය, ජේද පන්තිය ඉදිරියේ ඉදිරිපත් කිරීම.

**විමර්ශන**

<서울대학교 어학연구소 한국어 교재에 맞추어 엮은 한국어 쓰기 교본>(명지출판사. 2004)

<유학생을 위한 한국어 글쓰기의 실제>(하우.2007)

바로한국어쓰기2,<Get it Korean Writing>(Hawoo Publishing Inc.2019)

**නිපුණතාව** 7.0 ලිඛිත ව අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම** 7. 2 ලිඛිත ව අදහස් හුවමාරු කර ගනියි.

**කාලච්ඡේද** **15**

**ඉගෙනුම් පල**

- ලිපි, විද්‍යුත් ලිපි, කෙටි පණිවිඩ සහ දැන්වීම් යනාදිය මගින් අදහස් සහ තොරතුරු හුවමාරු කර ගනියි.
- දෙන ලද මාතෘකා යටතේ අදහස් ක්‍රමානුකූල ව පෙළගස්වමින් සරල රචනා සහ කතන්දර ලියයි.
- තම දින චර්යාව දින පොතක සටහන් කරයි.
- දෙන ලද පින්තූර බලා සරල වාක්‍ය ඇසුරෙන් කතාවක් ගොඩනයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- කෙටි පණිවිඩ, ලිපි, විද්‍යුත් ලිපි, සංවාද, රචනා සහ වෙළඳ දැන්වීම් ලිවීමේ දී අනුගමනය කළ යුතු සම්මත ආකෘතිය මෙන් ම අඩංගු විය යුතු කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න.
- එක් එක් ලේඛන රටාව අනුව අදහස් ක්‍රමානුකූලව පෙළ ගස් වන අයුරු දැනුවත් කරවන්න.
- ලබා දී ඇති ලේඛන සැකසීමේ දී ඒවායේ ඇති නිරවුල් බව, නිරවද්‍යතාව සහ සංක්ෂිප්ත බව පිළිබඳව ශිෂ්‍ය අවධානය යොමු කරන්න. (විද්‍යුත් ලිපි, කෙටි පණිවිඩ, දැන්වීම්)
- ලේඛනයේ දී සැලකිලිමත් විය යුතු ව්‍යාකරණ නිතී, ශිල්පීය ක්‍රම (විරාම ලක්ෂණ, පද බෙදීම, ඡේද වෙන් කිරීම) ආදීය කෙරෙහි අවධානය යොමු කරවමින් සුදුසු පරිදි විවිධ අභ්‍යාසවල යොදවන්න. (රචනා, කතන්දර වැනි)
- විවිධ මාතෘකාවලට අදාළ නාම පද, ක්‍රියා පද, විශේෂණ පද, යෙදුම් ආදිය සාකච්ඡා කර ශිෂ්‍යයාට තනි ව ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- ලිවීම ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ශිෂ්‍යයන් සමග අදාළ මාතෘකාව පිළිබඳ තොරතුරු එකතු කර ලේඛනය සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කර දෙන්න.
- විවිධ මාතෘකා යටතේ සරල රචනා ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- විවිධ මාතෘකා ඇසුරින් ලියන ලද රචනා එකතු කර රචනා පොතක් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න. (කේවල හෝ කණ්ඩායම් ක්‍රියාකාරකම්)
- පින්තූර ආශ්‍රයෙන් කතන්දර ගොඩ නැඟීමට උපදෙස් දෙන්න. (කේවල හෝ කණ්ඩායම් ක්‍රියාකාරකම්)
- ගුරුවරයා නිවැරදි කර දෙන වාක්‍ය, ඡේද නැවත නිවැරදි ව ලිවීමට අවස්ථාව දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- කෙටි පණිවිඩ
- දැන්වීම්
- විද්‍යුත් ලිපි
- ලිපි
- විවිධ මූලාශ්‍රයවලින් ලබා ගත් රචනා සහ කතන්දර
- දින පොත්
- පින්තූර

**තක්සේරුව හා ඇගයීම් සඳහා වන නිර්ණායක**

- විවිධ ලිපි, කෙටි පණිවිඩ, දැන්වීම්, සුබ පැතුම් පත් ආදිය මගින් තම අදහස් ලිඛිත ව ඉදිරිපත් කිරීම.
- කේවල හෝ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස විවිධ මාතෘකා ඇසුරින් ලියන ලද රචනා එකතු කර රචනා පොතක් නිර්මාණ කිරීම.
- පින්තූර ආශ්‍රයෙන් කතන්දර ගොඩ නැඟීම.
- නිවැරදි කර දෙන වාක්‍ය, ජේද නැවත නිවැරදි ව ලිවීම.

**විමර්ශන**

바로한국어쓰기2,<Get it Korean Writing>(Hawoo Publishing Inc.2019)

<서울대학교 어학연구소 한국어 교재에 맞추어 엮은 한국어 쓰기 교본>(명지출판사. 2004)

<유학생을 위한 한국어 글쓰기의 실제>(하우.2007)

**නිපුණතාව** 8.0 කොරියානු සාහිත්‍ය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනිමින් රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 8.1 කොරියානු ජන සාහිත්‍ය හා නූතන සාහිත්‍යය බිහිවීමෙහිලා බලපෑ සමාජ පසුබිම හා එහි සුවිශේෂී ලක්‍ෂණ අවබෝධ කර ගනිමින් සාහිත්‍ය නිර්මාණ රස විඳියි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- කොරියානු ජන සාහිත්‍යය හා නූතන සාහිත්‍යය බිහි වීමෙහි ලා බලපෑ සමාජ පසුබිම විස්තර කරයි.
- කොරියානු ජන හා නූතන සාහිත්‍යයේ සුවිශේෂී ලක්‍ෂණ ලැයිස්තුගත කර ප්‍රකාශ කරයි.
- කොරියානු නූතන සාහිත්‍යයේ පුරෝගාමී චරිත සහ ඔවුන්ගේ නිර්මාණ නම් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**කොරියානු ජන සාහිත්‍යය**

- කොරියානු ජන සාහිත්‍යය පිළිබඳව පැහැදිලි කරමින් එහි සුවිශේෂී ලක්ෂණ පිළිබඳව අවබෝධයක් ලබා දෙන්න.

- මුඛ පරම්පරාගත ව පැවත ඒම
- ජන සාහිත්‍යයේ වෙනස්වීම් මත කාල නිර්ණය අපහසු වීම
- සාමූහික ව නිර්මාණය කළ නිසා ඒක කර්තෘක නොවීම, කර්තෘ අඥාත වීම
- නොවියත් සාමාන්‍ය ජනයා අතින් නිර්මාණය වීමː සාමාන්‍ය ජනයාගේ ජීවිකාව මූලික කර ගෙන ඔවුන්ගේ ජීවිතය, අත්දැකීම්, විශ්වාස, හැඟීම් ආදිය නිරූපණය වීම
- සරල බව නිසා අසන්නාට පහසුවෙන් ග්‍රහණය කර ගැනීමටත් මතක තබා ගැනීමට පහසු වීම
- සර්ව සාධාරණත්වය
- එදිනෙදා කාර්යයන්ගේ දුෂ්කරතාවය මඟහැර කාර්යක්ෂමතාව ඇති කිරීම
- ආඛ්‍යාන (කතා කීමේ) ක්‍රමය භාවිත කිරීම
- යථාර්ථයක් නොවන සිදුවීමක් යථාර්ථයක් සේ ඉදිරිපත් කිරීම

- කොරියානු ජන සාහිත්‍යයෙහි දක්නට ලැබෙන සාහිත්‍ය පිළිබඳ විස්තර කරන්න

- ' 설화ː 'ජන කතා

මුඛ පරම්පරාවෙන් පැවත එන ක්‍රමවත් ව්‍යුහයකින් යුත් කතා ලෙස හැඳින්විය හැක. බොහෝවිට මෙකී ජන කතා වල මිත්‍යා කතා, පුරාවෘත්ත දක්නට ලැබෙන අතර ඒ ඒ ජන කොට්ඨාසයේ සිතුවිලි, සාරධර්ම, හැඟීම්, සංස්කෘතිය ඉන් ගම්‍ය වේ.

උදා: 단군신화, 의좋은 형제, 금도끼 은도끼

- ' 민요' ගැමි ගීත

සාමාන්‍ය ජනතාව අතරින් අව්‍යාජයෙන් නිර්මාණය වී මුඛ පරම්පරාගතව පැවත එන සාම්ප්‍රදායික ගීත විශේෂයකි. මෙකී ගීතවල ගේය පද හා තාලය ප්‍රදේශය, ගායනා කරනු ලබන පුද්ගලයාගේ රසාස්වාද මට්ටම, ගායනා කරන අවස්ථාව අනුව වෙනස් විය හැක. මේවා බොහෝවිට ජීවනෝපාය, සිරිත් විරිත්, ගැමි ක්‍රීඩා ආශ්‍රිත ව නිර්මාණය වී ඇති බැවින් දෛනික ජීවිතය හා සමීප සම්බන්ධතාවක් දැකිය හැක. ගොවිතැන් කිරීම, දඩයම් කිරීම ආදී සාමූහික කාර්යයන්හි නිරත වීමේ දී වෙහෙස මහන්සිය නිවා ගැනීම, සතුට බෙදා ගැනීම, කාර්යක්ෂමතාව වැඩි කිරීම, ප්‍රතිඵල අපේක්ෂා කිරීම යනාදි විවිධ හේතූන් මත පදනම් ව ගැමි ගීත නිර්මාණය වී ඇත.

උදා: ' 아리랑, 강강술래, 농가 '

- 민속극 - ජන නාටක

ජන ජීවිතය තේමාව කොටගත් සාම්ප්‍රදායික නාට්‍ය කලාව ලෙස හැඳින්විය හැක. මෙම ජන නාටක සංගීතය, නර්තනය, රංගනය සහ භාෂාව යන සියලු අංශයන්ගේ සංකලනයකි. කෘෂිකාර්මික චාරිත්‍ර සහ අවමංගල්‍ය උත්සව ආදී විවිධ ප්‍රාථමික ආගමික චාරිත්‍ර පාදක කරගෙන බොහෝ ජන නාටකවල ආරම්භය සිදු වී ඇතැයි සැලකේ. මේවා ලේඛනගත කර පැවත එන්නක් නොවන බැවින් දෙබස්වල නිශ්චිත පිටපතක් නොමැත. ජන ජීවිතයේ අවශ්‍යතාවන් මත නිර්මාණය වී ජනතාව අතරින් ම සංරක්ෂණය වී ප්‍රතිනිර්මාණය වූ නාටක ලෙස හැඳින් විය හැක.

가면극 (탈춤) - වෙස් මුහුණු නාටක

꼭두각시놀음 (인형극) - රූකඩ නාටක

- 속담 - ප්‍රස්තාව පිරුළු

ප්‍රස්තාව පිරුළු යනු පැරණි සමාජය තුළ දීර්ඝ කාලයක් පුරා පැවත එන අර්ථ පූර්ණ වූත් උපහාසාත්මක වූත් රසාත්මක කියමන් විශේෂයකි. කොරියානු සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රස්තාව පිරුළු ප්‍රධාන වශයෙන් විශේෂිත ඓතිහාසික සිදුවීම් හෝ දෛනික ජීවිතයේ දී නිතරන්තරයෙන් දක්නට ලැබෙන සාමාන්‍ය සිදුවීම් මුල්කර ගෙන නිර්මාණය වී ඇත. නමුත් බොහෝ ප්‍රස්ථා පිරුළු නිර්මාණය වී ඇත්තේ දෛනික ජීවිතයේ සිදුවීම් ආශ්‍රිතවයි. මේවා විවිධාකාරයෙන් වර්ග කළ හැකි අතර ඉන් එක් වර්ගීකරණයක් ලෙස, සතුන් ඇති කිරීම, සොබාදහම, වාසස්ථාන, ආචාර විධි, ආහාර, භාෂාව, ශරීරය යනාදිය දැක්විය හැක.

උදා: 식은 죽 먹기

우물 안 개구리

소 잃고 외양간 고친다

원숭이도 나무에서 떨어진다

불난 집에 부채질한다

- 수수께끼 - තේරවිලි

සතුට, විනෝදය ලබා ගැනීමටත් බුද්ධිය මැනීමටත් භාවිත කළ සාහිත්‍යාංගයක් ලෙස හැඳින්විය හැක. යමක් පිළිබඳ ව්‍යංගාර්ථයෙන් පවසා එය අනුමාන කිරීම මෙහිදී සිදුවේ. ප්‍රකාශ කරන්නා සහ අසන්නා යන දෙපිරිස ම සහභාගි වීම, සරල සහ කෙටි වාක්‍ය භාවිත කිරීම, හිතාමතාම නොමග යවන හෝ අසන්නගේ අවධානය වෙනතකට යොමු කළ හැකි ආකාරයේ යෙදුම් භාවිත කිරීම, බුද්ධිමය පරිකල්පනය වර්ධනය කිරීම යනාදි ලක්ෂණ දැකිය හැක. අතීතයේ නිර්මාණය වී පැවත එන තේරවිලි මෙන් ම වර්තමානයේ නිර්මාණය වූ තේරවිලි ද ඇත.

උදා: 눈을 감으면 보이고, 눈을 뜨면 안 보이는 것 - 꿈

들어갈 때는 구멍이 하나인데 나올 때는 구멍이 둘인 것 - 바지

세상에서 가장 큰 코 - 멕시코

**කොරියානු නූතන සාහිත්‍යය**

■ කොරියානු නූතන සාහි;‍යය පිළිබඳ පැහැදිලි කරමින් එහි සුවිශේෂී ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.

- 19වන සියවස අගභාගයේ සිට අද දක්වා වූ සාහිත්‍ය නූතන සාහිත්‍ය ලෙස හැඳින්විය හැක.
- 19වන සියවස අගභාගයේ වෙළඳ හා ආර්ථික සංවර්ධනය මත පදනම් වූ බටහිර සම්බන්ධතා කොරියානු නූතන සාහිත්‍ය බිහිවීමෙහි ලා බලපෑම් ඇති කිරීම (බටහිර නූතන සාහිත්‍ය ප්‍රවණතා සමග සමීප සම්බන්ධතාවක් දක්නට ලැබීම)
- ජපන් අධිරාජ්‍ය පාලන සමය තුළ බිහි වූ නිර්මාණ බොහෝමයක් ජපන් සාහිත්‍යයේ ආභාසය ලැබීම (එවක පූරෝගාමී සාහිත්‍යධරයන් බොහෝමයක් ජපානයේ අධ්‍යාපනය ලබා පැමිණීම - උදා: 이광수)
- 1919දී සම්ඉල් ව්‍යාපාරයත්(3.1 운동) සමඟ නූතන සාහිත්‍යය නව මාවතකට යොමු වීම. (ධනාත්මක ආකල්ප ප්‍රදර්ශනය කිරීම, එකල සමාජ තත්වයට මුහුණ දීමට උත්සාහ කිරීම, යථාර්ථය කෙරෙහි අවධානය යොමු කිරීම)
- 1945න් පසු උතුරු කොරියාව සහ දකුණු කොරියාව ලෙස බෙදී වෙන්වීමත් සමග නිර්මාණය වූ බොහෝ සාහිත්‍ය නිර්මාණ වල කොරියානු යුද්ධය සහ එහි ව්‍යාකූලත්වය පිළිබිඹු වීම

▪ නූතන සාහිත්‍යයේ පුරෝගාමී චරිත පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

- 이광수 (1892-1950)

ඔහු නවකතාකරුවෙකු මෙන්ම කවියෙකු ලෙස ද හැඳින්විය හැකිය. ඔහුගේ ප්‍රධාන කෘති අතරට '(무정), (단종애사), (흙)' යනාදිය ඇතුළත් වේ. '(무정):' කොරියානු නූතන සාහිත්‍යයේ ප්‍රථම දීර්ඝ නවකතාව ලෙස සැලකේ. එය 20වන සියවස මුල්භාගයේ නවීකරණය වීමත් සමග පැරණි සහ අලුත් දේ අතර සිරවුණු සමාජයක ජීවත්වන තරුණ බුද්ධිමතුන්ගේ නිදහස් ආදරය, ආත්ම-පරීක්ෂණය සහ ඉගෙනීමේ අභිලාෂය සිත්ගන්නාසුලු ලෙස ප්‍රදර්ශනය කරන නවකතාවකි.

- 김소월(1902-1934)

කොරියානු නූතන සාහිත්‍යයේ මුල්භාගය පෝෂණය කල කවියෙකු ලෙස හැඳින්විය හැක. ඔහු අතින් නිර්මාණය වූ කාව්‍ය බොහොමයක් සාම්ප්‍රදායික කොරියානු ජන ගීත සිහිපත් කරන ශෛලියකින් යුක්ත වීම, හදවතට වඩාත් සමීප වීම යනාදි ලක්ෂණවලින් යුක්ත වේ. ඔහුගේ ආයුකාලය කෙටි වුවද අදටත් කොරියන් ජාතිකයන් ඇලුම්කරන බොහෝ කාව්‍ය නිර්මාණ ඔහු අතින් රචනා වී ඇත. (진달래꽃), '(엄마야 누나야), (산유화)' ආදිය ඉන් කිහිපයකි. කොරියානු පුරවැසිභාවය ලබා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේ දී පවා '(진달래꽃)' කාගේ නිර්මාණයක්දැයි අසා ඇති අතර එයින් අදහස් වන්නේ ඔබ ' 김소월 ' නොදන්නේ නම් කොරියන් ජාතිකයෙකු වීමට සුදුස්සෙකු නොවන බවයි.

- දේශීය ජන සාහිත්‍යයේ සහ කොරියානු ජන සාහිත්‍යයේ සුවිශේෂී ලක්ෂණ සංසන්දනය කිරීමට යොමු කරන්න.
- දේශීය නූතන සාහිත්‍යයේ සහ කොරියානු නූතන සාහිත්‍යයේ සුවිශේෂී ලක්ෂණ සංසන්දනය කිරීමට යොමු කරන්න.
- කොරියානු ජන සාහිත්‍යය සහ නූතන සාහිත්‍යය පිළිබඳ වැඩිදුර තොරතුරු රැස් කිරීම සඳහා සුදුසු පරිදි පැවරුම් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- ලිපි
- PPT

**තක්සේරුව සහ ඇගයීම සඳහා වන නිර්ණායක**

- කොරියානු ජන සාහිත්‍යය සහ නූතන සාහිත්‍යය පිළිබඳ සංක්ෂිප්තව අදහස් ඉදිරිපත් කිරීම.
- කොරියානු ජන සාහිත්‍යය සහ නූතන සාහිත්‍යය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.
- කොරියානු ජන සාහිත්‍යය සහ නූතන සාහිත්‍යය පිළිබඳ වැඩිදුර තොරතුරු රැස් කිරීම.
- නූතන සාහිත්‍යයේ පුරෝගාමී චරිත පිළිබඳ කෙටියෙන් පැහැදිලි කිරීම.

**විමර්ශන**

- Encyclopedia of Korean Culture - http://encykorea.aks.ac.kr
- Encyclopedia of Korean Folk Culture - https://folkency.nfm.go.kr
- 전통농요 https://www.youtube.com/watch?v=jvfrzWXtKwk
- 단군신화 https://www.youtube.com/watch?v=GKDEhOFrAFA
- 탈춤 https://www.youtube.com/watch?v=hafKhb2shPw
- 민요 https://www.youtube.com/watch?v=UG5ylmtDwTE
- The story of Arirang https://www.youtube.com/watch?v=CxxpFegNLik

**නිපුණතාව** 8.0 කොරියානු සාහිත්‍ය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනිමින් රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 8.2 කොරියානු සාහිත්‍ය නිර්මාණ කියවා ඉන් ගම්‍ය වන අර්ථය සහ සුවිශේෂී ලක්ෂණ විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට සාහිත්‍යය නිර්මාණ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයයි.
- උගත් සාහිත්‍ය නිර්මාණ සාරාංශ ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ බිහි වූ යුගය කතුවරයා සහ කතුවරයාගේ වෙනත් සුවිශේෂ නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න.
- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ හඬ නගා කියවීමට යොමු කරන්න.
- සාහිත්‍ය නිරිමාණවල වචනාර්ථය, සාහිත්‍යාත්මක යෙදුම් ආදිය පැහැදිලි කරන්න.
- සාහිත්‍ය නිරිමාණවල තේමාව, භාෂාව, ආකෘතිය, අලංකාර භාවිතය, කාව්‍යෝපක්‍රම ආදී තොරතුරු පිළිබඳ සංවාදයේ යොදවන්න.
- ඒ ඒ නිර්මාණයට අදාළ අන්තර්ජාලයෙන් ලබා ගත හැකි වීඩියෝ දර්ශන හෝ හඬ පට බැලීමට/ඇසීමට හා තොරතුරු සෙවීමට යොමු කරන්න.
- උගත් සාහිත්‍ය නිර්මාණ කෙටියෙන් ලිඛිත හෝ වාචික ව ඉදිරිපත් කිරීමට සලස්වන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ලිපි
- වීඩියෝ දර්ශන
- හඬ පට
- PPT

**තක්සේරුව හා ඇගයීම් සඳහා වන නිර්නායක**

- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල ශිල්පීය උපක්‍රම විස්තර කිරීම.
- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් කියවා ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.
- උගත් සාහිත්‍ය නිර්මාණ කෙටියෙන් ලිඛිත හෝ වාචික ව ඉදිරිපත් කිරීම.

**විමර්ශන**

- 소가 된 게으름뱅이 https://www.youtube.com/watch?v=pbz-gzo0vf4
- 엄마야 누나야 https://www.youtube.com/watch?v=7kUjbR_C00k

**නිපුණතාව** 8.0 කොරියානු සාහිත්‍ය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනිමින් රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 8.3 සාහිත්‍ය නිර්මාණ කියවා රසාස්වාදය කර තම අදහස් ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** 04

**ඉගෙනුම් පල**

- උගත් ජන කතා ඇසුරෙන් සරල කොරියන් බසින් පිටපත් ලියා නාට්‍ය රඟ දක්වයි
- සාහිත්‍ය නිර්මාණයක රසය සාමුහිකව විචාරශීලිව සාකච්ඡා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- තනි හෝ කණ්ඩායම් වශයෙන් බෙදා ඒ ඒ නිර්මාණවල අන්තර්ගතය, චරිත සහ තම අදහස් පිළිබඳ සංවාදයේ යොදවන්න.
- සාකච්ඡා ඇසුරින් ගොනු කළ කරුණු පන්තිය ඉදිරියෙහි ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- ඒ ඒ සාහිත්‍ය නිර්මාණවල එන අවස්ථා, චරිත ආදිය රඟ දැක්වීමට අවස්ථාව සලසා දෙන්න.
- උගත් සාහිත්‍ය දැනුම ඇසුරින් ස්වයං නිර්මාණයක් කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ලිපි
- වීඩියෝ දර්ශන
- හඬ පට
- PPT

**තක්සේරුව හා ඇගයීම් සඳහා වන නිර්නායක**

- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ රස විඳ තම අදහස් විචාරශීලී ව ඉදිරිපත් කිරීම.
- උගත් සාහිත්‍ය දැනුම ඇසුරින් ස්වයං නිර්මාණයක් කිරීම.

**විමර්ශන**

- 소가 된 게으름뱅이 https://www.youtube.com/watch?v=pbz-gzo0vf4
- 엄마야 누나야 https://www.youtube.com/watch?v=7kUjbR_C00k

**නිපුණතාව** : 9.0 කොරියන් භාෂා ව්‍යවහාර හඳුනා ගෙන භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.1 දෛනික ජීවිතයේ විවිධ අවස්ථා හඳුනා ගෙන උචිත පරිදි භාෂාව නිවැරදි ව හසුරුවයි.

**කාලච්ඡේද** : 10

**ඉගෙනුම් පල** :

- උචිත භාෂා යෙදුම් සහ අංග චලන උපයෝගී කර ගනිමින් කොරියන් බසින් ඉදිරිපත් කිරීම් සිදු කරයි.
- සුදුසු භාෂා යෙදුම් භාවිත කරමින් පිරිසක් ඉදිරියේ කතාවක් පවත්වයි.
- පිළිගැනීමේ කතාවක් ඉදිරිපත් කරයි.
- රැස්වීමක්/උත්සවයක් අවසානයේ ස්තුති කතාවක් ඉදිරිපත් කරයි.
- උචිත කොරියන් භාෂා යෙදුම් සහ හැසිරීම් පිළිබඳව සැලකිලිමත් වෙමින් පෙරහුරු සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වෙයි.
- උත්සවයක නිවේදන කටයුතු සිදු කරයි.

**පාඩම සැලසුම සඳහා වන උපදෙස් :**

- දෛනික ජීවිතයේ දී හමුවන විවිධ අවස්ථාවල දී භාවිත කරන යෙදුම්, ඉරියව්, හැඟීම් ප්‍රකාශන ක්‍රම ආදිය ගැන සිසුන් දන්නා දේ පිළිබඳව සාකච්ඡා කරන්න.

  ඉදිරිපත් කිරීමක දී
  පිරිසක් ඉදිරියේ ඇමතීමේ දී
  සම්මුඛ පරීක්ෂණයක දී
  නිවේදන කටයුතුවල දී
  රෝහලකදී, කාර්යාලයක දී, වෙළඳ පොළක දී

- එක් එක් අවස්ථාවන්ට භාවිත කළ හැකි වාංමාලාව, ව්‍යාකරණ රටා, ප්‍රකාශන යනාදිය පිළිබඳ පැහැදිලි කරන්න.

උදා : 1. ඉදිරිපත් කිරීමක දී

지금부터 제 발표를 시작하겠습니다.

제 발표는 여기까지입니다.

잘 들어 주셔서 감사합니다.

උදා : 2. නිවේදන කටයුතුවල දී

오늘 이 자리에 참석해주신 귀빈 여러분을 환영합니다.

다음으로 환영사가 있겠습니다.

저는 오늘 사회를 맡은 ____________입니다.

- එක් එක් අවස්ථාවන්ට අනුව අංග චලනයන් උපයෝගී කරගන්නා ආකාරය පැහැදිලි කරන්න.
- එක් එක් අවස්ථාවන්ට ගැළපෙන ඇඳුම් පැළඳුම් හා සැරසිය යුතු ආකාරය පැහැදිලි කරන්න.
- ඉහත සඳහන් කළ අවස්ථා පංති කාමරය තුළ අනුකරණය කරමින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සහ පහසුකම් සලසා දෙන්න. (උදා ඃ සම්මුඛ පරීක්‍ෂණයක දී තමා හැසිරිය යුතු ආකාරය, භාවිත කළ යුතු කතා විලාසය, ඇඳුම, ශාරීරික ඉරියව්, කාල කළමණාකරණය, පෙර සූදානම, වැනි කරුණු අවධාරණය කරන්න.)
- සියලු අවස්ථාවන්ට අදාළව පෙර සූදානමේ දී ඒ ඒ අවස්ථාවට අදාළව කළ යුතු කාර්ය ලැයිස්තුවක් ලිඛිත ව සකසා ගන්නා ආකාරය සහ එහි වැදගත්කම සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්** :

- වීඩියෝ දර්ශන
- හඬ පට
- දෙබස් සහිත කාඩ්පත්
- වචන ලියූ කාඩ්පත්
- රූප කාඩ්පත් (විවිධ අවස්ථාවන් නිරූපණය වන පරිදි)

**තක්සේරුව හා ඇගයීම සඳහා වන නිර්ණායක**

- ලබාදී ඇති අවස්ථාවන්ට උචිත පරිදි නිවැරදි ව වාංමාලාව, ව්‍යාකරණ රටා හා ප්‍රකාශන ඇතුළත් කරමින් කොරියන් බසින් ඉදිරිපත් කිරීම් කිරීම (කණ්ඩායම් ක්‍රියාකාරකම්, යුගල ක්‍රියාකාරකම්).
- ඉහත සඳහන් කළ අවස්ථා පංති කාමරය තුළ අනුකරණය කරමින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගන්නා විට ඒ සඳහා එක් එක් ශිෂ්‍ය ශිෂ්‍යාවගේ ක්‍රියාකාරී සහභාගීත්වය තක්සේරු කිරීමට සාපේක්ෂ නිර්ණායක සකසා ගන්න.
- ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සහභාගී වන සියලු ම ශිෂ්‍යයන් සඳහා දිරිමත් කිරීම සහ අගය කිරීම මූලික කර ගනිමින් ප්‍රමාණවත් පරිදි ලකුණු ලබා දෙන්න. (මෙහි අරමුණ වන්නේ සියලුම ශිෂ්‍යයන් තුළ එක් එක් ශිෂ්‍යාට ආවේණික හැකියාවන් ඇති බව ඒත්තු ගැන්වීම සහ ඒ හැකියාවන් එළියට ගැනීම සහ දිරිමත් කිරීමයි.)

**විමර්ශන**

සම්මුඛ පරීක්ෂණයක දී - https://www.youtube.com/watch?v=ZlATIh5oqoQ

නිවේදන කටයුතුවල දී - https://www.youtube.com/watch?v=8McHu3lY33w,

https://www.youtube.com/watch?v=qjdop_rHCQw

https://www.youtube.com/watch?v=Yziy6nEwEGI

පිරිසක් ඉදිරියේ ඇමතීමේ දී - https://www.youtube.com/watch?v=gVLa1BPDm6c

https://www.youtube.com/watch?v=Odi25xOwPv8

ඉදිරිපත් කිරීමක දී - https://www.youtube.com/watch?v=dy_8ng0igYI

පිළිගැනීමේ කතාවක් ඉදිරිපත් කිරීමක දී - https://www.youtube.com/watch?v=WQ1-n3G4vH0

කොරියන් භාෂා කථික තරගයක දී - https://www.youtube.com/watch?v=z-w0Nr1p9is

https://www.youtube.com/watch?v=A_Gfg4vBWFM

https://www.youtube.com/watch?v=7MEMv4FjY0o

**නිපුණතාව** 10.0 භාෂාවේ ආවේණික ලක්ෂණ හඳුනා ගෙන පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම** 10.1 පරිවර්තනය කරනු ලබන හා පරිවර්තනයට ලක් වන භාෂාවල ආවේණික ලක්ෂණ සහ සමාන අසමානතා පිළිබඳව අවබෝධයෙන් යුතු ව පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- පරිවර්තනය කරනු ලබන භාෂාවට ආවේණික ලක්ෂණ සහ භාෂාත්මක විශේෂතා ආරක්ෂා කර ගනිමින් පරිවර්තනය කරයි.
- ලිඛිත පරිවර්තනයේ දී අනුගමනය කළ යුතු රීතිවලට අනුකූල ව පරිවර්තනය කරයි.
- එම ලක්ෂණවලට අදාළ ව පරිවර්තනයේ යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා වන උපදෙස් :**

- කොරියන් බසින් ලියවුණු විවිධ ලියවිලි (ඡේද, ලිපි, දැන්වීම්, පත්‍රිකා, චිත්‍රපට සහ ටෙලි නාට්‍ය දෙබස් පිටපත් කොටස් ) කියවා ඒවායේ ඇති විශේෂ ලක්ෂණ හඳුනා ගැනීමට උපදෙස් ලබා දෙන්න.

- ඇතැම් අවස්ථාවල භාවිත වන වචන තනි වචනයකින් පරිවර්තනය කළ නොහැකි බව උදාහරණ සහිත ව පෙන්වා දෙන්න.

  උදා: 부탁하다, 효도, 눈치, 답답하다

- සංස්කෘතිය දැක්වෙන ඇතැම් වචන සඳහා පැහැදිලි කිරීම් අවශ්‍ය බව පෙන්වා දෙන්න.

  උදා: 서예, 차도,

- කොරියන් භාෂාවට පමණක් ආවේණික සුවිශේෂී යෙදුම් හඳුන්වා දීම.

  උදා: 약을 먹다, 시험을 보다, 장을 보다

- සංවාදයේ යෙදීමේ දී පුද්ගලයින්ගේ වයස, තරාතිරම හෝ සමාජ මට්ටම අනුව භාෂාව භාවිත කරන ආකාරය වෙනස් වන බව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

උදා: 밥 먹었어?

밥을 먹었어요?

식사를 하셨어요?

친치를 드셨습니까?

**ගුණාත්මක යෙදවුම්**

- කොරියන් භාෂාවෙන් ලියවුණු දැන්වීම්, ලිපි, ඡේද, චිත්‍රපට සහ ටෙලි නාට්‍ය දෙබස් පිටපත් කොටස්

දැන්වීම්

| **영화 동아리 모임** |
|---|
| 영화 동아리 모임이 있습니다 |
| 한국 영화 '친구'를 봅나다. |
| 날짜 : 6월 12일 (수) |
| 시간 : 한국어 수업 후 오후 12시 |
| 장소 : 한국어 강의실 |

ඡේද

청개구리 (The Tale of the green frog)

옛날 어느 작은 연못에 엄마 청개구리와 아들 청개구리가 살고 있었어요. 아들 청개구리는 엄마 청개구리 말을 잘 듣지 않았어요. 항상 엄마 말의 반대로만 해서 엄마의 속을 썩였어요.

말을 듣지 않는 아들 청개구리 때문에 속이 상한 엄마 청개구리는 결국 병이 났어요. 엄마 청개구리는 자신이 오래 살지 못할 것을 알았어요. 그래서 항상 반대로만 하는 아들 청개구리에게 말했어요.

"아들아, 엄마는 오래 살지 못할 것 같구나. 내가 죽으면 나를 산에다 묻지말고 꼭 냇가에 묻어 줘."

그리고 며칠 후 엄마  청개구리는 세상을 떠났어요. 이렇게 엄마 청개구리가 돌아가시자 아들 청개구리는 매우 슬퍼했어요. 그동안 엄마의 말을 듣지 않은 것을 너무 후회했어요.

[단계별로 읽는 한국 전래도화, Mijeong Mimi Kim, Angela Lee Smith,2019]

**තක්සේරුව හා ඇගයීම සඳහා වන නිර්ණායක :**

- සරල කතා, ජනකථා, කවි, ගීත කණ්ඩ යනාදිය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම.
- දැන්වීම්/පෝස්ටර්, කාඩ්පත් යනාදිය කොරියන් භාෂාවට පරිවර්තනය කිරීම.

**විමර්ශන ඃ**

**නිපුණතාව** 10.0 භාෂාවේ ආවේණික ලක්ෂණ හඳුනා ගෙන පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම** 10.2 සහ 10.3

10.2 - කොරියන් බසින් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි.

10.3 - සිංහල/දෙමළ/ඉංග්‍රීසි බසින් කොරියන් භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- කොරියන් බසින් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි.
- සිංහල/දෙමළ/ඉංග්‍රීසි බසින් කොරියන් භාෂාවට පරිවර්තනය කරයි.
- ලබාදී ඇති ඡේද, ලිපි, දැන්වීම් යනාදියේ අර්ථය, ආචාර විධි, යෙදුම්, ප්‍රකාශන ආදියට හානියක් නොවන සේ පරිවර්තනය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- ලබා දී ඇති ඡේද, ලිපි, දැන්වීම් යනාදියේ අර්ථය, ආචාර විධි, යෙදුම්, ප්‍රකාශන පැහැදිලි වනසේ පරිවර්තනය කිරීමට උපදෙස් ලබා දෙන්න.
- සරල අවස්ථාවේ සිට සංකීර්ණ අවස්ථාව දක්වා පරිවර්තනය කිරීමට යොමු කරවන්න (ඡේද, ලිපි, දැන්වීම්).
- ආචාර විධි, සංස්කෘතිය හා සම්බන්ධ වචන, යෙදුම් පරිවර්තනය කළයුතු ආකාරය පැහැදිලි කරන්න.

උදා : 맛있게 드세요 (රසට කන්න)

잘 먹었습니다 (ගොඩක් කෑවා / ස්තුතියි)

**ගුණාත්මක යෙදවුම්**

- ඡේද
- ලිපි
- රචනා
- දැන්වීම්

**තක්සේරුව හා ඇගයීම සඳහා වන නිර්ණායක :**

- දෙන ලද ඡේද, ලිපි, දැන්වීම්, රචනා යනාදිය කොරියන් බසින් සිංහල/දෙමළ/ඉංග්‍රීසි බසටත්, සිංහල/දෙමළ/ඉංග්‍රීසි බසින් කොරියන් බසටත් නිවැරදි ව පරිවර්තනය කිරීම.

**විමර්ශන ඃ**


01. Fundamentals of Translation by SONIA COLINA

https://assets.cambridge.org/97811070/35393/frontmatter/9781107035393_frontmatter.pdf

02. Korean Language for a good job by Mi-Hye Lee, Ewha woman's University, Seoul. ISBN 89-7255-230-5

03. 배우기 쉬운 한국어 1(Easy to learn Korean 1) 성균관대학교, ISBN 89-7986-569-4

04. 이화 한국어 1-1, Ewha woman's University, Seoul. ISBN 978-89-7300-876-6-18710

05. 한국어 1: for G.C.E Ordinary Level Grade 10 textbook (2014. The Embassy of the Republic of Korea in Sri Lanka)

# ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවර්ධනය කිරීමේ ආධාරක I

**පාසල් වාරයඃ** තෙවන වාරය

**නිපුණතා මට්ටම ඃ** 1.1, 1.3, 9.1

**විෂය සන්ධාරයඃ** කොරියාවේ පිහිටීම, භූගෝලීය ලක්ෂණ සහ පරිපාලන ව්‍යුහය
කොරියානු ජන සමාජයට අදාළ විවිධ සංස්කෘතික අංග

**ආධාරකයේ ස්වභාවයඃ** ඉදිරිපත් කිරීමක්

**ආධාරකයේ අරමුණුඃ**

- කොරියාවේ පිහිටීම, භූගෝලීය ලක්ෂණ සහ පරිපාලන ව්‍යුහය ආශ්‍රිත මූලික දැනුම ප්‍රදර්ශනය කරයි.
- කොරියානු ජන සමාජයට අදාළ විවිධ සංස්කෘතික අංග හා එහි සුවිශේෂතා විස්තර කරයි.
- කොරියානු සමාජ සංස්කෘතික හා ජනජීවිතයට අදාළ කරුණු ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා සංසන්දනය කරමින් ඉදිරිපත් කිරීම් කරයි.
- කොරියානු සමාජ සංස්කෘතික හා ජන ජීවිතයට අදාළ විවිධ සංස්කෘතික අංග පිළිබඳ තම අදහස් ඉදිරිපත් කරයි.
- කොරියානු සංස්කෘතියට අදාළ තොරතුරු එක් රැස් කර කොරියානු සංස්කෘතිකාංග ප්‍රතිනිර්මාණය කර ප්‍රදර්ශනය කරයි.

**ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස්ඃ**

- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඉහත සඳහන් නිපුණතා මට්ටම් යටතේ දී ඇති විෂය සන්ධාරය ආවරණය වන ලෙස ගුරු මාර්ගොපදේශයේ දී ඇති තොරතුරු සහ උපදෙස්වලට අනුව ශිෂ්‍යයන්ට තොරතුරු සොයා ගැනීම සඳහා මාතෘකා කිහිපයක් ලබා දෙන්න.
  උදාඃ - කොරියාවේ භූ ගෝලීය පිහිටීම හා ලක්ෂණ ආශ්‍රිත කරුණු
  - විවිධ සංස්කෘතික අංග
- පන්ති කාමරයේ දී ලබා ගත් දැනුමට අතිරේක ව අන්තර්ජාලය ඇසුරින් තොරතුරු ගවේෂණයට ශිෂ්‍යයන් යොමු කරන්න.
- රැස් කර ගත් තොරතුරු පරිගණකය ඇසුරින් ආකර්ශණීය ලෙස සංවිධානය කර පංතිය ඉදිරියේ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන්න.

- කණ්ඩායමේ සියලු ම සාමාජිකයින් කොටස් වශයෙන් ඉදිරිපත් කිරීම කළ යුතුයි.
- එක් එක් ඉදිරිපත් කිරීම් සඳහා පහත නිර්ණායක ඔස්සේ ඇගයීම සිදු කළ යුතු අතර ඉදිරිපත් කළ තොරතුරු ඇසුරෙන් පොත් පිංචක් නිර්මාණය කර පන්තියේ අනෙක් ශිෂ්‍යයන්ගේ පරිශීලනය සඳහා ඉදිරිපත් කළ යුතුයි.

**ඇගයීම සඳහා නිර්ණායක**

- එක් රැස් කර ඇති අතිරේක තොරතුරු ප්‍රමාණය - ලකුණු 20
- අන්තර්ජාල සහ වෙනත් ආශ්‍රිත ග්‍රන්ථ පරිශීලනය - ලකුණු 20
- අවශ්‍ය අවස්ථාවලදී කොරියන් භාෂාව භාවිත කිරීම-ලකුණු 20
- තාක්ෂණය භාවිතය/පරිගණකය ආශ්‍රයෙන් ඉදිරිපත් කිරීම සිදු කිරීම- ලකුණු 10
- ආකර්ශණීය සහ නිර්මාණශීලී බව- ලකුණු 10
- කණ්ඩායමේ සියලු ම සාමාජිකයින් කොටස් වශයෙන් ඉදිරිපත් කිරීම- ලකුණු